# ‘පට්ඨාන ධර්ම දේශනා මාලාව’

## 6 වෙනි දේශනාව

නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධසස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධසස
නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුදධසස

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරහත් වූ සර්වඥ සම්මා සම්බුදුරජාණන්වහන්සේට අතීතය අනාගතය වර්තමානය කියන්නාවූ කාලත්‍රයට සම්බන්ධ සියලුම ධර්මයන්, නාම ධර්මයන් රූප ධර්මයන් ප්‍රඥප්ති ධර්මයන් සියල්ලන්ම සර්වප්‍රකාරයෙන්ම අවබෝධ කොට ගත්තාවූ ඒ අවබෝධ කොට ගත්තාවූ ධර්මය නිර්ලෝභීව ලෝකයාට කරුණාවෙන් දේශනා කොට වදාළා වූ මහා කාරුණික වූ සම්මාසම්බුදුරජාණන් වහන්සේට මම සිරසින් වැඳ නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

සම්මා සම්බුදුරජාණන්වහන්සේගේ උතුම් වූ විසද වූ ප්‍රභාෂ්වර වූ ප්‍රඥාවෙන් අවබෝධ කොට ගත්තාවූ ඒ උතුම් ධර්මස්කන්ධයට සිරසින් වැඳ නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

ඒ උතුම් ධර්ම මාර්ගයේ ගමන්කොට නිර්වාණ ධාතුව සපර්ශකොට වදාළා වූ ශ්‍රාවක මහා සංඝ රත්නයට සිරසින් වැඳ නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

බුද්ධ ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නයට නමස්කාර කිරීමේ කුසල චේතනා බලයෙනුත් බුද්ධ රත්නය ධම්ම රත්නය සංඝ රත්නයේ අනන්ත වූ අපරිමාණ වූ ගුණානුභාව බලයෙනුත් මේ පිංවත් සැම දෙනාටම අද මේ ධර්ම සාකච්ඡාව ධර්ම දේශනාව තුලින් කියල දෙන්න බලාපොරොත්තුව වන්නාවූ සියලුම ධර්ම කරුණුත් පැහැදිලිව තේරුම් ගැනීම සඳහා සියලුදෙනාටම සිහිය නුවණ යෝනිසෝමනසිකාරය පවත්වාගන්ට හැකිවේවා! සිත සමාධිගත භාවයෙන් පවත්වාගන්ට හැකිවේවා! නීවරණයන්ගෙන් බාධාවක් නොම වේවා! සැමදෙනාටම මේ ධර්ම කරුණු ටික ඉතාමත් හොඳින් වටහාගෙන තේරුම් අරගෙන එයම මාර්ගයක් කොටගෙන පරම ශාන්ත වූ නිර්වාණ ධාතුව සුවසේ අවබෝධ කරගන්ට ලැබේවා! කියල අපි මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා.

ඒවාගේම සියලු දෙනාටම ධර්ම මාර්ගයේ ගමන් කරන්ට හැකිවේවා කියල කරුණාබර සිතෙන් ප්‍රාර්ථනා කරනවා.

අද සැමදෙනාටම කථා කරන්ට තව ඇඳියක් තිබෙනවා. ඒ කියන්නේ ඉස්සර කථා කරගෙන ආපු කොටසෙම තව කොටසක් තිබෙනවා කියල දෙන්ට. අපි එක එක සිත් කාණ්ඩ අරගෙන තමයි මේ ප්‍රත්‍යය ධර්ම සලකා බැලීම සිද්ධ කළේ. මේ දවස්වල කථා කරන්නේ 'හේතු ධර්ම' 6 ය හිත්වල පවතින්නාවූ අනිත් ධර්ම වලට බලපවත්වන්නේ කොහොමද කියල. ඒක තමයි මේ දවස්වල කථා කරන මාතෘකාව. දැන් මම විස්වාස කරනවා මේ පිංවත් ධර්ම මණ්ඩලයේ ඉන්න සමාජික පින්වතුන්ට 'හේතු ප්‍රත්‍යය' ධර්ම පිළිබඳව යම් තරම් වැටහීමක් ඇත කියල. 'හේතු' ධර්ම අනිත් ඒවාට මූල කාරණයක් හැටියට උපකාරවන ආකාරය පිළිබඳව යම් කිසි වැටහීමක් ඇත කියල අප විස්වාස කරනවා. ඒ උනත් අපි තව ටිකක් මේක පින්වතුන්ට පැහැදිලි කරලා දෙනවා තවත් සිත් ටිකක් අරගෙන.

අද අපි කථා කරමු මහග්ගත සිත්වල ඇතිවෙන්නාවූ හේතු ධර්ම කොහොමද අනිත් ඒ හිතටත් චෛතසික ධර්ම වලටත් රූප වලටත් බලපවත්වන්නේ කියල. මේ කාරණය කියනකොට මම ආපස්සට අද වැඩිය යන්නේ නෑ. හේතුව මේ පින්වතුන්ට 'හේතු' ධර්ම පිළිබඳව ඒවා අනිත් ඒවාට උපකාර වීම පිළිබඳව යම්කිසි දැනුමක් යම් කිසි වැටහීමක් ඇතෙයි කියල අපි විස්වාස කරනවා.

සිත් තියෙනවා 89 ක්. මධ්‍යම ක්‍රමයට ගත්තහම. ඒ සිත් 89 යෙන් අපි මේ පින්වතුන්ට මතක් කරා 'හේතු' තිබෙන සිත් තිබෙනවා 71 කක්. සහේතුක සිත් කියන්නේ ඒවා. මේ 'හේතු' තිබෙන්නාවූ සිත් 71 කේ තිබෙනවා මහග්ගත කියල සිත් කොටසක්. මේක මේ පින්වතුන් දන්නවා නමුත් නැවතත් මතක් කරගනිමු. මහග්ගත කියල කියන්නේ 'මහා බවට' ගියාවූ 'මහත් තත්වයට' පත් වුනාවූ කියන එකයි. සිතක් මහග්ගත වෙන්ට නීවරණ යටයන්න ඕන. නීවරණ යට ගියහම නීවරණ යන්ගෙන් පෙළෙන්නේ නැති තත්වයට පත් උනාම ඒ හිත මහා තත්වයට, මහග්ගත භාවයට පත් වෙනවා.

මහග්ගත භාවයට පත් වෙච්ච සිත් තිබෙනවා කුසල වශයෙන් ගත්තයින් පස්සේ 9 යක්. ඒවාගේම විපාක වශයෙන් ගත්තයින් පස්සේ 9 යක් තිබෙනවා. මේ මහග්ගත සිත් ආර්යන් වහන්සේලාගේ සිතේ පවතින විට ඒවාට ලෝකෝත්තර සිත් කියල කථා කරනවා, නමුත් මේ මහග්ගත භාවයට ගියාවූ සිත ආර්යන් වහන්සේලාගේ හිතේ පහළ උනත් කුසල, විපාක, ක්‍රියා වශයෙන් සලකන නිසා මේක මහග්ගත භාවයම දාල සඳහන් කරනවා. මහග්ගත සිත් කියල කියන්නේ

රූපාවචර ධ්‍යාන සිත් 5 ක් සහ අරූපාවචර ධ්‍යාන සිත් 4 ක්. මේ කුසල. ඊළඟට රූපාවචර කුසල් සිත් පහේ විපාක එනම් රූපාවචර විපාක සිත් 5 සහ අරූපාවචර විපාක සිත් 4. මේවත් මහග්ගතයි. ඊළඟට ක්‍රියා වශයෙන් ගත්තම රූපා වචර ක්‍රියා සිත් 5 සහ අරූපාවචර ක්‍රියා සිත් 4. එතකොට තියෙනවා රූපා වචර කුසල් සිත් 5 අරූපාවචර කුසල් සිත් 4 එතකොට 9 ක් වෙනවා. මේ සිත් ගොඩට කියනවා මහග්ගත භාවයට ගියාවූ සිත් කියල. මේ සිත් වල කොහොමද 'හේතු' ධර්‍ම ක්‍රියාත්මක වෙන්නේ කියන කාරණය අපි මේ විදියට තේරුම් ගනිමු.

අපි හිතමු එක්කෙනෙක් භාවනා කරනවා. යෝගියෙක් භාවනා කරනවා. ඒ භාවනා කරන යෝගියා අපි හිතමු ආනාපාන සතිය වඩනවා කියල. ආනාපාන සති භාවනාව කරලා එයා උපදවා ගන්නවා ආනාපාන සති භාවනාවේ ප්‍රථම ධ්‍යානය. ආනාපාන සති භාවනාවේ ප්‍රථම ධ්‍යානය කියන්නේ පළවෙනි මහග්ගත සිත. ඒ පළවෙනි මහගත්ත සිතේ වැඩ කරනවා චෛතසික ධර්‍ම 33 ක්. හැබැයි මේ පින්වතුන් යම් කිසි පොතක් පතක් බැලුවයින් පස්සේ ඒවගේ සඳහන් කරලා ඇති 35 ක් කියල. එහෙම 35 ක් වෙන්නේ නෑ. 33 යි වැඩ කරන්නේ. අපි බලමු 33 වෙන්නේ කොහොමද කියල. දැන් මම කිව්වේ මොකක්ද? අනාපාන සති භාවනාව වඩන කොට වැඩු අනාපාන සති භාවනාවෙන් පහළ වෙනවා ධ්‍යාන සිතක්. ඒ ධ්‍යානය සිතේ පහළ වෙනවා චෛතසික ධර්ම 33 ක්. ඒ 33 තමයි

සර්ව චිත්ත සාධාරණ චෛතසික 7 + ප්‍රකීර්ණක චෛතසික ධර්‍ම 6 = 13

අනිවාර්යෙන්ම කුසල හිතක පහළ වෙන පොදු කුසල සාධාරණ චෛතසික 19 + ප්‍රඥාව (නුවණින් අනාපාන සති භාවනාව වඩන බැවින්) = 20

අන්‍ය සමාන 13 + කුසල සාධාරණ 19 + ප්‍රඥා චෛතසික (1) = 33

ඒ 33 යි + ඒ චෛතසික ධර්‍ම 33 වැඩ කරන පවතින ක්‍රියාත්මක

වන **සිත** (1) =34

*චෛතසික 34 ක් නෙමෙයි. චෛතසික (චිත්ත ගති) 33 + සිතයි = 34

මේ චිත්ත ගති හෙවත් චෛතසික ධර්‍ම 33 නේ තිබෙනවා හේතු 3 ක්. ඒ හේතු 3 තමයි අලෝභ හේතුව, අදෝස හේතුව, අමෝහ හේතුව. මේ අමෝහ කියන එක තමයි **ප්‍රඥා** චෛතසිකය. දැන් මේ හේතු 3 තියෙනවා. මේ හේතු තුන අපි අර ගොඩෙන් අයින්කරගත්තම තව ඉතුරු වෙනව චෛතසික ධර්‍ම 30 සහ **හිත**. මේ අලෝභ අදෝස අමෝහ කියන මේ හේතු 3 තදින් කාවදිනවා භාවනා අරමුණේ.

ඒ කියන්නේ ගත්ත අනාපාන සති භාවනා අරමුණේ මූල කාරණයක් හැටියට මූල භාවයෙන් ධ්‍යාන ආරම්මණයෙන් අහකට යන්නේ නැතුව හොඳට කිඳා බහිනවා. ඒකෙ රැඳෙනව. ඒකෙ මුල් අල්ලනවා. කරුණු තුනක් - අලෝභය කියන එක ධ්‍යාන අරමුණේ කා වදිනවා, ඒ කා වදිනවා කියන එක ලෝභ කිරීමක් නෙමෙයි. අලෝභය තියෙනවා අදෝසය තියෙනවා අමෝහයත් තියෙනවා. අමෝහය යම් කිසි ප්‍රමාණයකට ශක්ති සම්පන්නව අරමුණ විනිවිද දකිනවද, අමෝහය යම් තරම් ප්‍රමාණයකට අමෝහී වෙනවද, මුලා නොවෙනවද ඒ ප්‍රමාණයට අද්වේශයේ අලෝභයේ ස්වභාවය පවතිනවා. දැන් මේ කරුණු 3 අර භාවනා ආරම්මණය සම්බන්ධයෙන් තදින් බලගැන්විලා මුල් අල්ලල තිබෙන නිසා අනිත් චෛතසික 30 ට සහ හිතටත් වෙන කොහේවත් යන්න බෑ - මේ තුන්දෙනාට අනුයාත වෙන්න සිද්ධ වෙනවා. ආන්න එතැනදී තිබෙනවා හේතු ධර්මය අනිත් චෛතසික ධර්මයන්ට ප්‍රත්‍යය වන විදිය. උපකාර වෙන විදිය.

අපි හේතු ප්‍රත්‍යය ධර්ම කථා කරන කොට කරුණු තුනක් හිතේ තියා ගන්ටෙයි කියල කිව්වා. ඒ කරුණු තුන තමයි

1). උපකාරක ශක්තිය තිබෙන ධර්ම ස්වභාවය - ප්‍රත්‍යය ස්වභාවය

2). ඊළඟට ඒ උපකාරය ලබාගෙන වැඩ කරන්නාවූ ක්‍රියාත්මක වෙන්නාවූ ප්‍රත්‍යය උප්පන්න ධර්මය. නාම ධර්ම හැටියට ගත්තයින් පස්සේ මෙතන තිබෙනවා ප්‍රත්‍යය උප්පන්න ධර්ම තියෙනව 31 කක්. කෙලින්ම පිරිසිඳු, හේතු කථා කරන්නේ නැති ධර්ම 31 තියෙනවා. එකින් එක හේතු සමග ගත් විට නාම ධර්ම සියල්ලම 33 තියෙනවා. (හේතු වලත් තිබෙනවා උවුනොවුන්ට ප්‍රත්‍යය වන ස්වභාවය. එතකොට 33 වෙනවා) හැබැයි පිරිසිඳුව අපිට පටලැවිල්ලක් නැතුව තේරුම ගන්න මේ හේතු ධර්මතුන අයින් කරල ගත්තොත් එහෙම තියෙන්නේ හේතු නොවන චෛතසික 30 + හිතයි = 31.

මේ හිත සහ චෛතසික යන පච්චුප්පන්න ධර්ම 31 හේතු තුනේ බලපෑමට යටත් වෙනව සහ ප්‍රත්‍යයට යටත් වෙනවා. මේ දැන් කථා කරේ ප්‍රත්‍යය සහ ප්‍රත්‍යය උප්පන්න ධර්ම 31 ප්‍රථම ධ්‍යානය වශයෙන් ප්‍රථම ධ්‍යාන මහග්ගත සිතේ.

ඊළඟට තව එකක් තියෙනව - එතනදී ඔය සිත පහළ වෙන කොට ඒ සිතත් එක්ක - දැන් සිත එක පොකුරටනේ පහළ වෙන්නේ. දැන් ප්‍රථම ධ්‍යාන මහග්ගත සිත පහළ වෙන්නෙ චෛතසික ධර්ම සමූහයක්, ධර්ම පොකුරක් සමග. එතන තියෙන ප්‍රධානියා හිත. මේක රූප ගොඩක වැඩ කරන සිතක් නිසා මේ හිතත් එක්කම ඇඟේ හැදෙනවා රූප ධර්ම සමූහයක්. ඒවා චිත්තජයි. එතකොට මේ ප්‍රථම ධ්‍යාන

හිතේ තිබෙන හේතු ධර්ම තුන අලෝභයත් අදෝසයත් අමෝහයත් කියන ප්‍රඥාව යන තුන අනිත් චෛතසික ධර්ම 30 ත් සිතටත් ඊළඟට ඒ හිත නිසා පහළ වෙන්නාවූ රූප ධර්මයන්ටත් බල පවත්වනවා ප්‍රත්‍යය වශයෙන්, ඒවා තමයි ප්‍රත්‍යය උප්පන්න ධර්ම. රූපයි චෛතසිකයි ඊළඟට හිතයි = ප්‍රත්‍යය උප්පන්න ධර්ම

ප්‍රථම ධ්‍යාන විපාක සිතෙත් ඔය විදියමයි. ඒවාගේම ප්‍රථම ධ්‍යාන ක්‍රියා සිතෙත් ඔය විදියමයි. විපාක ක්‍රියා කියල නාමික ස්වභාවය සහ කර්ම එක්කාසු කිරීමේ තිබෙන්නාවූ වෙනස සිද්ධ වෙනවා මිසක චෛතසික ධර්මයන්ගේ එහෙ මෙහෙ වීමක් වෙන්නේ නෑ.

දෙවෙනි සිතට ගියායින් පස්සේ අපි හිතමු මෙහෙම. තව එක්කෙනෙක් භාවනා කරල එයා දෙවනි ධ්‍යානයට යනවා. දෙවෙනි ධ්‍යානයට ගියායින් පස්සේ ඒ ධ්‍යානය සිතේ වැඩ කරන්නේ චෛතසික ධර්ම 32 යි. ඒ 32 වෙන්නේ 'විතර්කය' අතහැරීමෙන්. සූත්‍ර ක්‍රමයේ හැටියට විතර්කය විචාරය දෙකම අතහරිනවා. මෙතන වැඩ කරන්නේ විතර්කය නැතිව චෛතසික ධර්ම 32 ක්. මෙතනත් වැඩ කරනවා හේතු ධර්ම තුනක් එනම් අලෝභය අදෝසය අමෝහය. මේ හේතු ධර්ම තුන අනිත් ධර්මතා ටිකට බලපවත්වනවා. ප්‍රත්‍යය උප්පන්න ධර්ම තමයි සිත අනිත් චෛතසික ධර්ම සහ පහළ වෙන්නාවූ චිත්තජ රූප.

ඊළගට අපි තුන්වෙනි ධ්‍යාන සිතට ගියහම බලන්න කොච්චරක් අඩු වෙනවද කියල. විතර්කය අයින් වෙන්න ඕන. විචාරය අයිවෙන්න ඕන. ඒ දෙකම අයින් වෙනවා. සාමාන්‍යයෙන් අනාපාන සති භාවනා හිතේ පහළ වෙන්නේ චෛතසික ධර්ම 33 යි. හැබැයි මෙතැන අයින්වෙනවා චෛතසික ධර්ම 2 කක්. විතර්කය සහ විචාරය. එතකොට වැඩ කරන්නේ චෛතසික ධර්ම 31 යි. ඒ 31 සිතත් සමග ගත්තයින් පස්සේ නාම ධර්ම 32 යි. එතනදී හේතු වශයෙන් කථා කරන්නාවූ අලෝභය අදෝෂය අමෝහය, හිතටත් චෛතසික ධර්ම වලටත් ඒ නිසා පහළ වෙන්නාවූ රූප ධර්ම සමූහයටත් බලපවත්වනවා මූල කාරණයක් මූල හේතුවක් මූල ප්‍රත්‍යය ධර්මයක් හැටියට. ඒ ධර්ම සමූහය තමයි අලෝභයත් අදෝෂයත් අමෝහයත් නොවන ඉතිරි ධර්ම ටික තමයි ප්‍රත්‍යය යෙන් හට ගන්නාවූ ප්‍රත්‍යය උප්පන්න ධර්ම හැටියට සඳහන් කරන්නේ.

තවත් ඩිංගක් ඉදිරියට ගියාට පස්සේ හතරවෙනි ධ්‍යානයේදී චෛතසික ධර්ම 3 ක් අයින්වෙන්න ඕන. විතර්කය අයිවෙන්ට ඕන, විචාරයත් අයින් වෙන්නට ඕන, ප්‍රීති කියන චෛතසික ධර්මය අයින් වෙන්න ඕන. එතකොට එතැන ඉතුරු වෙන්නේ චෛතසික ධර්ම 30 යි.

ඒ චෛතසික ධර්ම 30 + හිත = නාම ධර්ම 31

එතන වැඩ කරන්නාවූ අලෝභය අද්වේසය අමෝහය කියන හේතු ටික ඒ හිතටත් ඒ චෛතසික ධර්ම 27 ටත් බලපවත්වනවා ප්‍රධාන උපකාරක ධර්ම හැටියට.

අපි පස්වෙනි එකට ගියාට පස්සේ එතනදී සිද්ධ වෙන්නේ මොකක්ද? එතනදී සිද්ධ වෙනවා - විතර්කයත් නෑ විචාරයත් නෑ ප්‍රීතියත් නෑ සුඛයත් නෑ. ඒ ධ්‍යාන අංග හැටියට ගත්තයින් පස්සේ. මෙතන සුඛය කියල කියන එක චෛතසිකයක් කියල කිව්වට ධ්‍යාන අංගයක් උනාට එතැන වේදනා චෛතසිකයයි තියෙන්නේ. එතනත් වැඩ කරන්නේ අර ඉස්සෙල්ලා කියපු ගානම තමයි. මේක ධ්‍යාන 5 හේ ක්‍රමයක්.

1). පළවෙනි ධ්‍යාන සිතේ චෛතසික 33 ක් ගත්තා

2). දෙවෙනි එකේදී විතර්කය අයින් කරා

3). තුන්වෙනි එකේදී විතර්ක විචාර දෙකම අයින් කරා

4) හතරවෙනි එකේදී විතර්ක විචාර ප්‍රීති තුනම අයින් කරා

5) පස්වෙනි ධ්‍යාන අවස්ථාවට යන කොට අනාපාන සති ධ්‍යාන මහග්ගත සිත්වල සූත්‍ර ක්‍රමයට හතර හෝ අභිධර්ම ක්‍රමයට පස්වෙනි ධ්‍යානය. ඒකෙ වැඩකරන්නේ චෛතසික ධර්ම සමාන්‍යයෙන් 30 යි. ඒ තමයි උපේක්ෂා සහගත ස්වභාවය නිසා ප්‍රීති විතක්ක විචාර සහ ප්‍රීති ධර්මතා තුනම වැඩ කරන්නේ නැහැ අයින් වෙනවා. හොඳට පිරිසිදුව උපේක්ෂාව ප්‍රඥාවත් සිහියත් එක්ක ගැලපිලා වැඩකරනවා. එතකොට අභිධර්ම ක්‍රමයේ හැටියට පස්වෙනි ධ්‍යාන සිතේ පවතින ඒ හේතු තුන සිතටත් ඉතිරි චෛතසික ධර්මයන්ටත් ඒ නිසා පහළ වන්නාවූ චිත්තජ රූපයන්ටත් බලපවත්වනවා මූල හේතු කාරණා හැටියට.

දැන් මෙහෙම කියාගෙන යනකොට කිව්වේ රූපාවචර ප්‍රථම ධ්‍යානය, දෙවෙනි ධ්‍යානය, තුන්වැනි හතරවැනි පස්වැනි ධ්‍යාන වශයෙන් කුසල සිතත් විපාක සිතත් ක්‍රියා වශයෙන් තිබෙන්නාවූ සිත් තුනේ යෙදෙන්නාවූ චෛතසික ධර්ම අනිත් ඒවාට බලපාන විදිය - ප්‍රත්‍යය සහ ප්‍රත්‍යය උප්පන්න වෙන විදිය.

දැන් අපි හිතා ගනිමු ඕක සාමාන්‍යයෙන් උපකල්පනාත්මකව නැත්නම් ධර්ම මනසිකාරයක් පැවැත්වීම වශයෙන් ඕක තේරුම් ගත්තයි කියල. ධර්මය අහනකොට තිබෙනවා ප්‍රත්‍යක්ෂව ධර්ම අවබෝධය සහ ධර්ම මනසිකාරමය අවබෝධය කියල. හැබැයි ප්‍රත්‍යක්ෂය තමයි හොඳම වශයෙන් තියෙන්නේ. දැන්

මේක ධර්‍ම දේශනාවක් හින්ද දෙසන්නාවූ කරුණු වලට අනුකූලව උපකල්පනාත්මක ස්වභාවයක් ඇතිවෙනවනේ. ඒක නරක නෑ හොඳයි ධර්‍මය තේරුම් ගන්ට. හැබැයි ප්‍රත්‍යක්‍ෂය තමයි ඉතාමත් හොඳම අවස්ථාව.

දැන් අපි රූපාවචර ධ්‍යාන සිත් පහ කථා කළා. මේ ධ්‍යාන සිත් 5 ම මහග්ගතයි. මහග්ගත භාවයට ගිය ධ්‍යාන සිත්.

ඊළඟට තියෙනවා අරූපාවචර ධ්‍යාන සිත් 4 ක්. අරූපාවචර ධ්‍යාන සිත් 4 රේ වෙනසක් වෙන්නේ නෑ. ධ්‍යාන සිත් හතරේ අරමුණු වෙනස් වෙනවා මිසක ධ්‍යාන සිත් වල යෙදෙන්නාවූ චෛතසික ධර්‍ම වල වෙනසක් වෙන්නේ නෑ. චෛතසික ධර්‍ම අර මුලින් කියපු පංචම ධ්‍යානයේදී කියපු චෛතසික ධර්‍මමයි. වෙනස් වෙන්නේ ඒ ධ්‍යාන වල අරමුණ පමණයි. ආකාස අරමුණ, විඤ්ඤාණ අරමුණ, ආකිඤ්චඤ්ඤායතන අරමුණ, නේවසඤ්ඤානාසඤ්ඤා කියන සංඥා අරමුණ යන මේ හතර වෙනස් වෙනවා.

සිත වශයෙන් චෛතසික ධර්‍මයන්ගේ ප්‍රමාණ වශයෙන් එකයි. ඔය මම මේ කිව්වේ අනාපාන සති භාවනාවේදී අනාපාන සති ධ්‍යානයක් වඩාගත්තාවූ කෙනකුගේ ඒ ධ්‍යාන සිත් වලට අනුකූලව පවතින්නාවූ චෛතසික ධර්‍මයන්ගේ යෙදීම සහ හේතු වශයෙන් පවතින ප්‍රත්‍යය ධර්‍ම ටික අනිත් ඒවාට බලපාන්නේ කොහොමද කියන කාරණය.

ඊළඟ කාරණය කියන්න ඉසෙල්ලා මේ පින්වතුන්ට මතක් කිරීමක් කරනවා. මේ ධර්‍ම මණ්ඩලයේ ඉන්නවා බණ අහල අහලම හොඳට කියවල යම්කිසි ගැඹුරු කාරණයක් තේරුම්ගන්ට පුළුවන් උත්සාහයක් දරන සහ හැකියාවල් හදාගත්තු අයත් ඉන්නවා. මධ්‍යම ප්‍රමාණයේ ධර්මඥාණයක් තිබෙන්නාවූ අයත් ඉන්නවා. ඒවාගේම සමහර කෙනක් අලුත්. ඉතින් ඒ අයත් ඉන්නව. ඉතින් ඒ යම්කිසි කෙනකුට මේ කියන දේවල් යම්කිසි ප්‍රමාණයක අවබෝධයක අඩුවක් එහෙම ඇත්නම් තේරුම් ගැනීමට අපහසු ගතියක් අපැහැදිලි තැනක් එනවනම් ඒක පසුව අපෙන් ප්‍රශ්න වශයෙන් විමසා සිටින එක හොඳයි. ඒකට අනුකූලව අපිට ඒ ධර්‍ම කරුණු ටික පැහැදිලි කරලා දෙන්න පුළුවන්.

මම දැන් තවත් තැනක කාරණයක් කියනවා මෙහෙම. අපි හිතමු කෙනෙක් මෛත්‍රී භාවනාව කරනවා කියල. මෛත්‍රී භාවනාව කරන කොට චෛතසික යෙදිල්ල කොහොමද වෙන්නේ. මෛත්‍රී භාවනාව භාවනාව කරන කොට යෙදෙන්නෙත් චෛතසික ධර්‍ම 33 යි. 'මෛත්‍රී' කියල කියන්නේ මොකක්ද එතකොට? 'අව්‍යාපාද' කියන චෛතසිකය. ඒ කියන්නේ 'අදෝෂ' කියන

චෛතසිකය. අදෝෂ කියන චෛතසිකය තමයි මෛත්‍රී කාරණය. මෛත්‍රී ගුණය. එතන වැඩ කරන්නෙත් චෛතසික ධර්ම 33 ක් එක්ක හිත.ඊළඟට චිත්තජ රූප ටික.

ඊළඟට තියෙනව තව එකක්. යම් කිසි කෙනක් දුකට පත් වුනාවූ අය පිළිබඳ කරුණාව ඇතිකර ගන්නවා. කරුණා භාවනාව වඩනවා. කරුණා භාවනාව වඩන කොට වෙනස්. අපි හිතමු කරුණා භාවනාව වඩල ප්‍රථම ධ්‍යානයට ගියා කියල. කරුණා භාවනා සමාපත්තිය කියල. එතැනදී වැඩ කරන්නේ චෛතසික ධර්ම 34 යි. 34 ක් වෙන්නේ මෙහෙමයි -

අන්‍යසමාන චෛතසික ධර්ම 13 + කුසල සාධාරණ චෛතසික ධර්ම 19 + ප්‍රඥාව (1) = චෛතසික ධර්ම 33 + කරුණා චෛතසික = 34 + සිත (1) = සියලුම නාම ධර්ම 35

ඒ 35 දෙනාගෙන් 3 දෙනෙක් අයින් වෙනවා 'හේතු' හැටියට. අලෝභයත් දෝෂයත් අමෝහයත්. ඔය විදියට තමයි කරුණා ධ්‍යාන හිතක චෛතසික ධර්මයන්ගේ යෙදීම වෙන්නේ.

මුදිතාවට ගියැන් පස්සේ ඒකෙත් ඔය විදියට වෙනසක් සිද්ධ වෙනවා. හැබැයි මේ කරුණා භාවනාව, මෛත්‍රී භාවනාව, මුදිතා භාවනාවන්ගෙන් යන්න පුළුවන්කම තියෙන්නේ ධ්‍යාන හතරක් විතරයි. ඒකෙන් පස් වන ධ්‍යානයකට යන්ට බෑ. ඒ කියන්නේ පස්වෙනි ධ්‍යානයේදී සතුට නැතිවෙනවා. උපේක්ෂා සහගත වෙනවා. කරුණාව මෛත්‍රීය මුදිතාව යන මේ භාවනා තුන හැමවෙලේම සතුටින් පිරිච්ච 'ප්‍රීතිය' වැඩ කරන්නාවූ භාවනා අරමුණු.

දැන් ඔය කියපු මහග්ගත - රූපාවචර - කුසල, විපාක, ක්‍රියා යන සිත් 15 වේත් මහග්ගත - අරූපාවචර - කුසල, විපාක, ක්‍රියා යන සිත් 12 ත් වැඩ කරන්නාවූ චෛතසික ධර්මයන්ගේ 'හේතු' භාවයෙන් අලෝභය අදෝසය අමෝහය වැඩ කරන විදියත්, ඒවාගේම ප්‍රත්‍යය උප්පන්න ස්වභාවයෙන් ඒවාට අලෝභය අදෝසය අමෝහය යන තුන් දෙනාගේ බලය යෙදෙන විදියත්. ඒ නිසා මේවා හටගන්නා විදියත් බලපවත්වන විදියත් තමයි ඔය මේ පින්වතුන්ට අපි මතක් කරේ.

දැන් මේ පළවෙනි කාරණය, මොකක්ද පළවෙනි කාරණය කියල කිව්වේ? පට්ඨාන ධර්මයේ ප්‍රත්‍යය ධර්ම 24 ක් තිබෙනවා. ඒ 24 පළවෙනි 'හේතු ප්‍රත්‍යය' ගැන තමයි මේ දවස්වල කථා කරන්නේ.

ඊළඟට තව කාරණයක් තියෙනව පැටලැවෙන. මේ ටික මම තනියෙන් තනියෙන් අරගෙන කථා කරේ, තනිකරලා වෙන වෙනම කාරණයක් හැටියට කථා කරේ, සමහර කෙනෙකුට මේකේ ප්‍රශ්න මතුවෙනවා සාමූහික වශයෙන් ගත්තහම. ඒ සාමූහික වශයෙන් ගන්නවා කියල කියන්නේ මෙහෙමයි.

සිත් ඔක්කෝම ටික ගන්නවා. 89 යම. 89 න් අහේතුක සිත් ටික අයින් කරලා අනිත් සිත් 71 ම අරගෙන ඒ හිත් 71 ම ඔයවගේ කොටස් කරන්නේ නැතුව 'කුසල' බෙදන්නේ නැතුව 'අකුසල' බෙදන්නේ නැතුව 'මහග්ගත' බෙදන්නේ නැතුව 'ලෝකෝත්තර' බෙදන්නේ නැතුව ඔක්කෝම ගත්තයින් පස්සේ චෛතසික ධර්ම 38 ක් වැඩ කරනවයි කියල ගන්නවා. කුසල වශයෙන් චෛතසික ධර්ම 38 යි සිත් වශයෙන් මෙච්චරයි රූප උප්පත්ති වශයෙන් මෙහෙමයි කියල වෙන් කරන්නේ නැතුව කියපු ගමන් කෙනෙකුට ඒක තෝරා ගන්න අමාරුයි. සමහර පොත්වල එහෙම දක්වල තිබෙන්නෙ ඒවාගේ කෙටි සාමූහික වශයෙන් අරගෙන, කෙටි විස්තර විග්‍රහ තමයි තියෙන්නේ. ඒක නිසා කෙනෙකුට ප්‍රශ්නේ වෙන්නේ පච්චනීක ධර්ම හොයන්ට ගියැන් පස්සේ තමයි ඔය හැල හැප්පිල්ල වෙන්නේ. ඒක නිසා ඒක ඇරෙන්ට තමයි මම මේ තනි තනි කරලා ගත්තේ.

ඊළඟට තියෙනව අර 'අහේතුක' සිත් තියෙනවා 18 ක්. ඒ අහේතුක සිත් 18 කථා කරන්නේ නෑ 'හේතු' දාල. ඒවා 'අහේතු' නෙ. ඒවා ගැනෙන්නේ 'ප්‍රත්‍යනීක' ධර්ම යටතට. ඒකෙ එක ප්‍රශ්නයක් අපේ පිංවත් මහත්තයෙක් ඇහුව මට මතක හැටියට ගිය පාර එකේ හරි ඊට ඉස්සෙල්ල එකේ හරි. මම හිතුව මොකක් හරි ඔය ගොඩේ පටලැවිල්ලක් වෙන්න ඇති කියල ඒ සංඛ්‍යා ගන්න කොට. ඇයි අන්‍ය සමාන චෛතසික ධර්මයන්ගේ 'ඡන්ද' චෛතසිකය ප්‍රත්‍යනීක ධර්මයක් නොවන්නේ කියල. ඡන්ද චෛතසිකය ප්‍රත්‍යනීක ධර්මයක් නොවන්න හේතුව ඡන්දය කියන චෛතසිකය අහේතුක සිත් වල ක්‍රියාත්මක වෙන්නේ නැති නිසා. අනෙත් ඒවා ක්‍රියාත්මක වෙනවා. හැබැයි ඒ සිත් 18 න් සිත් 10 ක්ම තියෙනවා සබ්බ චිත්ත සාධාරණ චෛතසික ධර්ම විතරක් වැඩ කරන. අනිත් 8 තමයි අනිත් ප්‍රභේදයට අන්තර්ගත වෙන්නේ. ඔය අපි කිව්වේ මහග්ගත සිත් සහ මහග්ගත සිත්වල 'හේතු ප්‍රත්‍යය' වශයෙන් සහ 'ප්‍රත්‍යය උප්පන්න' වශයෙන් චෛතසික ධර්ම වැඩ කරන විදිය.

ඊළඟට අපි ගත්තොත් ලෝකෝත්තර සිත් එක ක්‍රමයකට තියෙනවා 8ක් අනෙක් ක්‍රමයට තිබෙනවා 40 ධ්‍යාන වශයෙන් ගත්තහම. ඒ ලෝකෝත්තර ධ්‍යාන සිත්

වශයෙන් ගත්තයින් පස්සේ ඒවායේ වැඩ කරන්නෙත් ධ්‍යාන වල යෙදුන චෛතසිකමයි.

ලෝකෝත්තර සිත් කියල කියන්නේ ඔක්කොම කුසල් සිත්. ඒ කුසල සිත්වල, මාර්ග සිත්වල, ඵල සිත්වල චෛතසික සංග්‍රය කරන කොට ධ්‍යාන වල කථා කරපු විදියටම චෛතසික යෙදීම ගන්නවා. එච්චරයි ඒකෙ වෙනසකට තියෙන්නේ. පොඩි වෙනසක් තිබුනොත් එහෙම අපි ඔක්කොම ටික අරගෙන කුසල් සිත්වල චෛතසික ධර්‍ම 38 ක් වැඩ කරනවා කියලා කියනවා. ඉතින් වෙනම ගත්තයින් පස්සේ එක සිතකට යෙදෙන ගාන අපි බලා ගන්ට ඕන. දැන් මම වේ වෙලාවේ මේ පින්වතුන්ට ඉස්සෙල්ල කියල දීපු එකක දිග ඇඳියක් තමයි විස්තර කළේ.

අපේ දන්න කියන පින්වත් මහත්ම මහත්මීන් ඉන්නවා මෙතන ඊට අමතරව අද මම පොඩි කැමැත්තක් තිබෙනවා ධර්‍ම දැනුමෙන් යම් කිසි විදියකින් ආදුනික වශයෙන් හෝ්වේවා මේ ධර්‍ම සභාවට එහෙම නැත්නම් මේ සාකච්ඡා වලට මැතකදී සම්බන්ධ වීම් හෝ වශයෙන් හෝ වේවා එහෙම නැත්නම් මේකේ අපැහැදිලි තැන් තියෙනවා නම් ඒවා දැනගන්න කැමැත්තෙන් ඉන්න අය හෝ වේවා ප්‍රශ්න නගනව නම්, ඒ ටික අපිට කියල දෙන්න පුළුවන්ය කියල අපි මෛත්‍රීයෙන් සිහිපත් කරනවා. මෙතැනින් එහාට මොනවහරි දෙයක් තියෙනවා නම් මේ පින්වතුන්ට ප්‍රශ්න වශයෙන් අහන්න පුළුවන්. අපි ප්‍රශ්න වශයෙන් අහල තවත් මේකේ හිර වෙච්ච තැන් තියෙනවා නම් ඒවාගේම ගලවාගෙන විස්තර කර ගන්න ඕනෑ තැන් තියෙනවා නම් ඒ පැත්තට හැරෙමු. විශේෂයෙන්ම තවත් එකක් මතක් කරන්ට ඕනෑ. පට්ඨාන ධර්‍ම විග්‍රහ කරනකොට වචන සීමාවක තියෙන්නේ. හරි පරෙස්සමින් තමයි මේක හසුරුවන්න ඕන වෙන්නේ. හේතුව, ප්‍රත්‍යය ධර්‍ම කථා කරන කොට අපි අද කථා කරන්නේ මොන ප්‍රත්‍යය ධර්‍මද එහෙම නැත්නම් සූවිසි ප්‍රත්‍යය යෙන් අද ඉන්නේ කොතනද - මොකක්ද මේ කථා කරන්නේ කියන එක පළමුකොටම හිතේ තියෙන්න ඕන. නැත්නම් පටලැවෙනවා. සමහර වෙලාවට ආරම්මණ ප්‍රත්‍යයට පටලැවෙන අවස්ථා තිබෙනවා. සමහර වෙලාවට කර්ම ප්‍රත්‍යයත් එක්ක පටලැවෙන අවස්ථා තිබෙනවා. සමහර වෙලාවට අත්ථි ප්‍රත්‍යයත් එක්ක පටලැවෙන අවස්ථා තිබෙනවා. අද කථා කරේ ඉස්සෙල්ල කථා කර ඒ මාතෘකාවේම දික් ගස්සපු තවත් පැහැදිලි කර දෙන්ට මහහැරී ගියාවූ කොටසක්. මේ පින්වතුන්ට දැන් ඒ සම්බන්ධයෙන් තිබෙන්නාවූ, මේ මාතෘකාවට අදාළ කරගෙන ප්‍රශ්න අහන්න පුළුවන්. ඒ අහන ප්‍රශ්න හැම එකකටම ලැබෙන්නාවූ උත්තරය සැම දෙනාටම ප්‍රයෝජනවත් වෙනවා. සැම

දෙනාටම දහම් පාඩම නැවත නැවත හිතල බලල අහල මෙනෙහි කරලා අවබෝධකරගන්න හේතු වන කොටසක් වේවා. සැමදෙනාටම මේ ධර්ම මාර්ගයේ ගමන් කිරීමෙන් මෙනෙහි කිරීමෙන් ධර්ම අවබෝධය වේවා කියල මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. දැන් මෙතන ඉදල ඉදිරියට ධර්ම සාකච්ඡාවට යොමු වෙමු. තෙරුවන් සරණයි!

තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස අප්‍රමාණ පිං

<u>ප්‍රශ්නයක්</u> - අවසරයි සවාමීන් වහන්ස අනන්ත අප්‍රමාණ පිං ඔබවහන්සේට අපිට මේවා කියල දෙනවට. ස්වාමීන් වහන්ස රූපාවචර ධ්‍යාන වලදී ඒ හට ගන්නා සිතේ හේතු ප්‍රත්‍යය රූපයට බලපානවා වගේ අරූපාවචරයෙදීත් එහෙම වෙනවද? නැත්නම් අරූපාවචර නිසා රූපයට බල පෑමක් නැතුවාද?

<u>පිළිතුර</u> - ඒකත් ප්‍රශ්න කළ යුතුයි. ඒකෙ තියෙන්නේ මෙහෙමයි. දැන් කුසල් සිත් දොළහක් තියෙනවනේ. රූපාවචර සිත් 5 යි අරූපාවචර සිත් 4 යි. ඒකෙන් රූපාවචර සිතේදී හේතු ධර්ම 3 හිතටයි ඒ චෛතසික ධර්ම ටිකටයි රූප වලටයි හේතු ප්‍රත්‍යය යෙන් ප්‍රත්‍යය වෙනවා. දෙවෙනි ධ්‍යානයේදී ඒ හේතු ධර්ම 3 දෙවෙනි ධ්‍යාන හිතටයි දෙවෙනි ධ්‍යාන හිතේ වැඩ කරන චෛතසික ධර්ම ටිකටයි ඒ දෙවෙනි ධ්‍යානය නිසා පහළ වන්නාවූ රූප ටිකටයි හේතු ප්‍රත්‍යය යෙන් ප්‍රත්‍යය වෙනවා. තුන්වෙනි එකේදී ඒත් ඒ හේතු ධර්ම 3 තුන්වෙනි ධ්‍යාන සිතටයි ඊළඟට චෛතසික ටිකටයි චිත්තජ රූප ටිකටයි බලපවත්වනවා. හතරවෙනි එකේදිත් ඔය කාරණය ඔය විදියට සිද්ධ වෙනවා. හේතු ධර්ම 3 චෛතසික ධර්ම ටිකටයි හිතටයි චිත්තජ රූප ටිකටයි බලපවත්වනවා. පස්වෙනි හිත ඇවිල්ල උපේක්ෂා සහගත එකනේ. ඒ පස්වෙනි එකේදිත් ඒ හේතු ධර්ම 3 පස්වෙනි ධ්‍යාන හිතටයි ඒ පස්වෙනි ධ්‍යාන හිතේ තිබෙන්නාවූ චෛතසික ධර්ම ටිකටයි පස්වෙනි ධ්‍යාන හිත සමග පහළ වෙන්නාවූ රූප ටිකටයි හේතු ප්‍රත්‍යය යෙන් ප්‍රත්‍යය මූල භාවයෙන් උපකාර වෙනවා ප්‍රත්‍යය වෙනවා.ඊළඟට දැන් අරූපාවචරනෙ - අරූපාවචර වල වෙන්නේ - ඔන්න එක්කෙනෙක් භාවනා කරලා මනුෂ්‍ය ලෝකෙ රූපාවචර ධ්‍යාන 5 හම උපදවා ගත්ත. දැන් එතනින් එහාට අරූපාවචර භාවනාව වඩනවා. අරූපාවචර භාවනාවේදී තියෙන්නේ ඒකම චෛතසික ගාන. ඒ හිතේ තිබෙන හේතු ධර්ම 3 අරූපාවචර ධ්‍යාන හිතටයි චෛතසික ධර්ම ටිකටයි බලපවත්වනවා ඒ එක්කම ඔය අරූපාවචර ධ්‍යාන හිත මෙහෙ වැඩ කරනකොට ඒ ධ්‍යාන හිත එක්ක වැඩ කරනවා රූප ධර්ම මෙහෙ. ඒ අරූපාවචර ධ්‍යාන සිත්වල රූප හදන්නේ නැත්තේ ‘විපාක’ වශයෙන් ඒ බ්‍රහ්මලෝකයකට ගියහම. ඒ මනුස්සය මෙහෙ

භාවනා කරනකොට රූප ටික තියෙනවනේ. දැන් මෙහෙ භාවනා කරලා අරූපාවචර ධ්‍යාන වඩලා එයා විපාක වශයෙන් අරූපාවචර බ්‍රහ්මලෝකේ යම්කිසි දවසක ඉපදුනොත් එදාට විපාක වශයෙන් මෙයාට රූප වැඩ කරන්නේ නෑ. හැබැයි මෙහෙ මේ මනුස්සයා - භාවනා කරන එක්කෙනා - එයා අරූපාවචර කුසල් 'විපාක' විඳීමක් නෙමෙයි මේ කරන්නේ මෙතන වාඩිවෙලා මෙයා අරූපාවචර කුසල් සිත් හදනවා. ඒ ධ්‍යාන සිත් හදනවා. ඒ ධ්‍යාන සිත් එක්ක රූප හදනවා. ඔය විදියටයි ඕක තේරුම් ගන්න ඕනවෙන්නේ. තෙරුවන් සරණයි!

බොහොම පිං තෙරුවන් සරණයි ස්වාමීන් වහන්ස

<u>ප්‍රශ්නය</u> - ගරුතර ස්වාමීන් වහන්ස මගේ ප්‍රශ්නය වටිනා එකක් නෙමෙයි. මගේ කුතුහලයක්මයි. දැන් මට යමක් ඇහෙනවා. ඇහුන වෙලාවේ ඉඳල මට ඇහෙනවා කියන එක දැනගන්න ඒ අතර තුර සිත් කීයල පහළ වෙන්වද ස්වාමීන්වහන්ස තෙරුවන් සරණයි?

<u>පිළිතුර</u> - මට දැන් යමක් ඇහෙනවා. ඒ ඇහුනට පස්සේ ඒක ඇතුලට ගිහිල්ලා හිත ඒක බාර ගන්නවා. සිත් ගොඩක් පහළ වෙනවා. එක විදියකට කියන්න පුළුවන් සංඛ්‍යාත්මකව මෙහෙම. ඇත්ත වශයෙන්ම ඒක උපකල්පනයක් විතරයි හැබැයි ඒ අතර තුර මෙච්චරක්ම පහළ වෙනව කියල කියන්න බෑ. අපි හිතමු මෙන්න මෙහෙම - ඔන්න දැන් තමන්ට දෙයක් ඇහුන. ඇහිච්ච ගමන් ඒ ඇහෙන හිත මොකක්ද? **සෝත විඤ්ඤාණය**. සෝත විඤ්ඤාණය ඉවර වෙච්ච ගමන්ම **සම්පටිච්ඡන** සිතක් පහළ වෙනවා. **සන්තීරණ** සිතක් පහළ වෙනවා. **වොත්තපන** සිතක් පහළ වෙනවා. ඊට පස්සේ **ජවන්** සිත් 7 පහළ වෙනවා. එතකොට දැන් කියක් පහළ උනාද? 10 පහළ උනා. ඊට පස්සේ පහළ වෙනවා තව **තදාලම්බන** සිත් දෙකක් පහළ වෙනවා. ඊට පස්සේ 12 වෙනවා. ඒ 12 ඉවර උනාට පස්සේ **භවාංග** වෙනවා. භවාංග සිත් පහළ උනාට පස්සේ භවාංග 17 ක්ද 18 ක්ද 100 ක් යනවද කියන්න බෑ. ඒ ටික ඉවර වෙච්ච ගමන් තව line එකක් යනවා. මනෝද්වාරික සිත් පේළියක් යනවා. ඒ මනෝද්වාරික සිත් පේළියේ තියෙනවා මනෝද්වාරික සිත **මනෝද්වාරාවජ්ජන සිත** ඊට පස්සේ ජවන් සිත් 7 යනවා. එතැන 8 ක් තියෙනවා. ඊට පස්සේ **තදාලම්බන** දෙකක් යනවා. එතකොට 10 ක් වෙනවා. ඊට පස්සේ ඒ හැරිච්ච හිත. ඊට පස්සේ ප්‍රඥප්තිය අරමුණු කරන ඊට පස්සේ ප්‍රඥප්තිය සහ අර්ථග්‍රහණය කරන්නාවූ මනෝ ද්වාරික චිත්ත වීථියක් යනවා. ඒකෙත් හොඳට වැඩ කරන්නාවූ සිත් තියෙනවා 8 ක්. ඊළඟට ඔය විදියට

ගිහිල්ලා යනවා සිත්, ඒක හැබැයි ප්‍රමාණයක් කරන්න බෑ. දෙවෙනි චිත්ත වීථියේ වැඩ කරන්නාවූ සිත් 10 ය 10 ය 10 යනවා. මනෝද්වාරික මනොද්වරාවජ්ජන සිත සහ ජවන් සිත් ඊට පස්සේ යනවා තදාලම්බන. ඔය විදියට ගිහිල්ලා අවසානෙදි පස්වෙනි range එකේ යනකොට තමයි ඇලීම සිද්ධවෙන්නේ. ඒ වෙනකොට භවංග සිතුයි චිත්ත වීථි වල සිතුයි මහා ගොඩක් ගිහිල්ලා තියෙන්නේ. එකක් දෙකක් නෙමෙයි.

බොහොම පිං ස්වාමීන්වහන්ස මට දැන ගන්න ඕන වෙලා තිබුනේ විඤ්ඤාණයේ වේගය. ඒක බොහොම ලස්සනට පැහැදිලි කරලා දුන්න. බොහොම පිං ස්වාමීන්වහන්ස.

හොඳයි තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි ගෞරවනීය ස්වාමීන්වහන්ස මට පොඩ්ඩක් පැහැදිලි කර ගන්න පුළුවන්ද ස්වාමීන්වහන්ස අර ප්‍රථම ධ්‍යාන මහග්ගත සිත පහළ වන විට චෛතසික ධර්ම 33 සමග සිතයි සියලුම නාම ධර්ම 34 යි. ඒ 34 න් ප්‍රත්‍යය ධර්ම 3 අලෝභ අදෝස අමෝහ ප්‍රත්‍යය ධර්මත්, ඉතුරු චෛතසික ධර්ම 31 යි ඒකෙන් උපදින රූප ධර්මයි ඒ කොටස ප්‍රත්‍යය උප්පන්න ධර්ම ද කියල දැන ගන්න කැමතියි ස්වාමීන්වහන්ස. අවසරයි තෙරුවන් සරණයි !

<u>පිළිතුර</u> - ඒක හරි ඒක එහෙම තමයි. ඒ කියපු කථාව හරි. ආයිත් මට විස්තකරන්න දෙයක් නෑ. තෙරුවන් සරණයි

<u>ප්‍රශ්නය</u> - ..... පැහැදිලි මදි

<u>පිළිතුර</u> - ඒ කියන්නේ කුසල සාධාරණ චෛතසික ‘සෝබන සාධාරණ’ කියල නම් කරනවා. කුසල සාධරණ කියල හිතාගත්තට කමක් නෑ. කුසල් සිතක් පහළ වෙන කොට අනිවාර්යෙන්ම කුසල් සිතේ තිබෙන්නාවූ චෛතසික තිබෙනවා සාධාරණ 19 ක්. ඒක අනිවාර්යෙන්ම තියෙනවා. ඒ ටික නැතුව කුසල සිතක් පහළ වෙන්නේ නෑ. ඒ චෛතසික තමයි - සද්ධාව - සති - හිරිය - ඔත්තප්ප - අලෝභ - අදෝස - තත්‍රමජ්ඣතා - කාය පස්සද්ධි - චිත්ත පස්සද්ධි - කාය ලහුතා - චිත්ත ලහුතා - කාය මුදුතා - චිත්ත මුදුතා - කාය කම්මඤ්ඤතා - චිත්ත කම්මඤ්ඤතා - කාය පාගුඤ්ඤතා - චිත්ත පාගුඤ්ඤතා - කයජ්ජුකතා චිත්තුජ්ජුකතා - මේ 19 අනිවාර්යෙන්ම කුසල් සිතක යෙදෙනවා. ඊට පස්සේ අනිත් ඒවා එහෙට මෙහෙට වෙනවා. තව තියෙනව 6 ක්. සමහර කුසල් සිත් තියෙනව ප්‍රඥා නැති. ඥාන විප්‍රයුක්ත ඒවා. එතකොට ප්‍රඥාව වැඩ කරන්නේ නෑ.

ප්‍රඥාව වැඩ කරපු එක ඥාන සම්ප්‍රයුක්ත වෙනවා. මම හිතන්නනේ මේක වැටහෙන්න ඇති කියල.

<u>ප්‍රශ්නය</u> - අවසරයි ස්වාමීන්වහන්ස පොඩි ප්‍රශ්ණයක්. අර ලෝකෝත්තර සිත් වල පහළ වෙනවනේ සවමීන්වහන්ස සම්මා දිට්ඨි - සම්මා සංකප්ප ආදී වශයෙන් ආර්ය අශ්ඨාංගික මාර්ගයේ ඒ තියෙන කරුණු. ඒවා  චෛතසික වශයෙන් බලනවද ස්වාමීන්වහන්ස එතකොට ඒවා කොහොමද අපි හඳුන ගන්නේ අර චෛතසික 52 ඇතුලේ තියෙන චෛතසික වලින්. පොඩ්ඩක් පැහැදිලි කරල දෙන්න.තෙරුවන් සරණයි !

<u>පිළිතුර</u> -  ඒක සරලයි මහත්තය පොඩි උපක්‍රමයක් කියල දෙන්න පුළුවන් අපේ පින්වතුන් සැමදෙනාටම මාර්ග සිත් වල වැඩ කරන චෛතසික ධර්ම තේරුම් ගන්ට. ඇත්ත වශයෙන්ම කුසල චෛතසික තිබෙනවා 25. ඒ 25 වෙන්නේ ඔය දැන් මම කියපු 19 (සද්ධාව  - සති - හිරිය  - ඔත්තප්ප  -  අලෝභ  - අදෝස - තත්‍රමජ්ඣතා  - කාය පස්සද්ධි  - චිත්ත පස්සද්ධි -  කාය ලහුතා -  චිත්ත  ලහුතා - කාය මුදුතා  - චිත්ත මුදුතා - කාය කම්මඤ්ඤතා - චිත්ත කම්මඤ්ඤතා - කාය පාගුඤ්ඤතා  -  චිත්ත  පාගුඤ්ඤතා  -  කයජ්ජුකතා  චිත්තුජ්ජුකතා)  +  ප්‍රඥා චෛතසික = 20

තව තියෙනවා චෛතසික ධර්ම 3 ක්. ඒ තමයි සම්මා වාචා  චෛතසිකය - සම්මා කම්මන්ත චෛතසික - සම්මා ආජීව චෛතසිකය. ඒවත් කුසල්. එතකොට 23 ක්  වෙනවා.

තව තියෙනවා කරුණා චෛතසික සහ මුදිතා චෛතසිකය කියල චෛතසික ධර්ම දෙකක්. එතකොට 25 ක් වෙනවා. මේ 25 න් ලෞකික පැත්තට තිබෙන චෛතසික 2 තිබෙනවා. ඒක ලෝකෝත්තර වෙන්නේ නෑ. ඒ චෛතසික ධර්ම 2 තමයි කරුණා චෛතසිකය සහ මුදිතා චෛතසික යන දෙක. හේතුව කරුණාව කුසල් හැබැයි  සත්ව සංඥාවක් තියෙන්ට ඕන. මුදිතාව කුසල් හැබැයි සත්ව සංඥාවක් තියෙන්ට ඕන. මෛත්‍රීය - කරුණාව - මුදිතාව දක්වන්නේ හැම වෙලේම සත්වයෝ කියල අල්ලගෙන. හැබැයි නිවන් දකින වෙලාවේ මේ කරුණා චෛතසිකය මාර්ග සිත්වල වැඩ කරන්නේ නෑ. මුදිතා චෛතසිකය මාර්ග සිත්වල වැඩ කරන්නේ නෑ. හේතුව නිවනේ සත්තු නෑ. නිවන නිස්සත්ත නිජ්ජීව ධර්මයක්නේ. සත්වයෝ පුද්ගලයෝ  ආත්ම ජීව නිවනේ නෑ. ඒක අසංඛත ධාතුවක්. ඒකනිසා නිවනට මෛත්‍රීය වඩනට බෑ. ‘නිවන හොඳින් පවතීවා, ඔය ලොව්තුරා බුදු පසේ බුදු රජාණන්වහන්සේලාට ඇවිල්ල බලන්න’ - එහෙම

කරන්ට බෑ. ඒක අසංඛත ධර්ම ස්වභාවයක්. ශූන්‍ය කියන එක නෙමෙයි. ඔය සමහරු කියනවා ශූන්‍යයි කියල. නෑ, ශූන්‍යය නෑ. යමක් තියෙනවා. ඒක නිසා මේ චෛතසික ධර්ම 25 න් කරුණාවයි මුදිතාවයි දෙක ලෝකෝත්තර සිත්වල වැඩ කරන්නේ නෑ. ලෝකෝත්තර සිත්වල වැඩ කරන්නේ චෛතසික ධර්ම කුසල් වලින් 23 ක් විතරයි. එතකොට 23 ඔහොම ගත්තම මහත්තයල එකතු කරන්න අන්‍ය සමාන චෛතසික ධර්ම 13 .

**( කුසල් චෛතසික 23 + අන්‍යසමාන චෛතසික 13 = 36 )** එතකොට 36 වෙනවා. ධ්‍යාන වශයෙන් ගත්තයින් පස්සේ ඒ ධ්‍යානයේ හැටියට තමයි ඕක යොදන්නේ. හැබැයි ඍජුව ගත්තයින් පස්සේ ඔය චෛතසික ධර්ම තමයි එක්ක යෙදෙන්නේ. ප්‍රඥාව අනිවාර්යයෙන්ම යෙදෙනවා. අර විරති ධර්ම 3 අනිවාර්යෙන්ම යෙදෙනවා. එතකොට 23 වෙනවා. මම හිතනවා මේක තේරෙන්න ඇති කියල.

ස්වාමීන්වහන්ස එතන සම්මා දිට්ඨිය හැටියට යෙදන්නේ ප්‍රඥාව නේද ස්වාමීන්වහන්ස.

<u>ස්වාමීන්වහන්සේ</u> - ඔව් සම්මා දිට්ඨිය හැටියට යෙදන්නේ ප්‍රඥාව. අමෝහය හැටියට යෙදෙන්නෙත් ප්‍රඥාව. විද්‍යාව හැටියට යෙදෙන්නෙත් ප්‍රඥාව. නම වෙනස් ධර්මය එකයි. සම්මා සංකප්පය හැටියට වැඩ කරන්නේ ප්‍රකීර්ණක වල තියෙන ‘විතර්ක’ චෛතසිකය. ඒ කියන්නේ විතර්කය සම්මා සංකප්පය හැටියට වැඩ සටහන් කරමින් නිර්වාණ අරමුණ පැත්තට හිත ගොඩ කරලා දන්නේ.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස මට සියල්ලම වැටහුනා නමුත් මහග්ගත චිත්ත කියන එක භූමි වශයෙන් බෙදිච්ච එකක්ද ඒක ඇතුලත් වෙන්නේ සිත් 89 කොයි කොටසටද කියල ස්වාමීන්වහන්ස මගේ ප්‍රශ්නය. තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - ඔව් මහත්තය ඒ කියන්නේ මහග්ගත කියන්නේ මහත් භාවයට ගියාවූ කියන තේරුමෙන්. මහග්ගත සිත් කොට්ඨාස දෙකක් එකට කරනවා මහත්තය. දැන් කාමාවචර සිත් - රූපාවචර සිත් - අරූපාවචර සිත් - ලෝකෝත්තර සිත් - කියල කාණ්ඩ 4 බෙදා ගන්නවනේ. ඒ කාණ්ඩ 4 රේ මැද ගොඩවල් දෙක (රූපාවචර සිත් + අරූපාවචර සිත්) එකට කරලා ගන්නවා. ඒ එකට කරලා අරගෙන කථා කරනව ඒ ටික සලකනවා ‘මහග්ගත’ යනුවෙන්. ඒ කියන්නේ ‘මහත් භාවයට ගිය’ කියන එකයි. ඒකට හේතුව ‘මහත් භාවයට ගියේ’ ‘ලෝකෝත්තර භාවයට ගිය’ කියන එක නෙමෙයි. මහත් භාවයට ගියා කියල

කියන්නේ අර කාමාවචර පහත් හීන තත්වයේ තිබෙන කාමාවචර ගොඩෙන් අයින් වෙලා විසාලත්වයට ගියා කියන එකයි. අනිත් එක තමයි භාවනා කිරීමේදී අරමුණු තියෙනවා. ඒවත් ඇවිල්ල බොහෝම සියුම් වෙච්ච මහත් භාවයට විස්තාර භාවයට සියුම්වෙලා යන්නාවූ අරමුණුත් එක්ක වැඩ කරන හින්ද මහග්ගත ස්වභාවයට පත්වෙනවා. ඒක නිසා (රූපාවචර - කුසල, විපාක, ක්‍රියා ) + ( අරූපාවචර - කුසල, විපාක, ක්‍රියා ) තමයි මහත්තය මහග්ගත ස්වභාවයට ගිය සිත් හැටියට සලකන්නේ. තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - අවසරයි ස්වාමීන් වහන්ස අද පාඩමට අදාළ නෙමෙයි නමුත් හුඟක් තැන්වල අහල තිබෙනවා 'තෙරුවන් සතු සූවිසි ගුණ මහිමය' කියල. ඒක කියලදෙන්න ගොඩක් වෙලා ගත වෙනවනම් වෙන දවසක හරි ස්වාමීන් වහන්ස කියල දෙන්න පුළුවන් නම් බොහොම පිං. තෙරුවන් සරණයි !

<u>පිළිතුර</u> - සූවිසි ගුණ දැනගන්ටනම් මේ ධර්‍ම ගැඹුරින් ඉගෙන ගන්ට ඉගෙන ගන්ට තමයි සූවිසි ගුණ නම් තේරෙන්නේ. අපි 'ඉතිපිසෝ ගාථාව' 'ස්වාක්ඛාතෝගාථාව' 'සුපටිපන්නෝ ගාථාව' කිව්වට ඒ ගාථා අස්සේ තියෙන දේවල් පුදුම විදියට මතු වෙන්නේ බුදුරජාණන්වහන්සේගේ කරුණාව බුදුරජාණන්වහන්සේගේ දයාව මෛත්‍රිය බුදුරජාණන්වහන්සේට 'සත්ථා දේව මනුස්සානං' කියන්නේ කුමක් නිසාද - දෙවියන්ට මනුස්සයන්ට කරේ මොකක්ද කියන එක හොඳට හරවත් ලෙස වැටහෙන්නේ අවබෝධ වෙන්නේ මේ ගැඹුරු ධර්‍ම විනිවිද විනිවිද බල බලා යනකොටයි. එතකොටයි බුදුරජාණන් වහන්සේගේ ගුණ මහිමය තේරෙන්නේ - ඒක මහා සාගරයක්. මම එකතැනක දැක්ක බුදුරජාණන් වහන්සේට වන්දනා කරන ගාථා සමූහයක්. ඒ ගාථා සමූහය බැඳල තිබුනේ බුරුම ජාතික භාවනා කරන ස්වාමීන් වහන්සේ නමක්. ඒ බුරුම ජාතික විපස්සනා වඩන ස්වාමීන්වහන්සේ විදර්ශනා භාවනාව කරන්ට ගිහිල්ලා විදර්ශනා භාවනාව කරගෙන යනකොට බුදුරජාණන්වන්සේ දැකපු හැටි. උන්වහන්සේගේ ඒ භාවනා හිතට වැටහිච්ච පෙනිච්ච හැටි බුදුරජාණන්වන්සේගේ භාවනා හිත මුල් කරගෙන තමයි ඒ වන්දනාව සකස් කරල තියෙන්නේ. සමහර කරුණු තියෙනවා ඇත්තම කියනවනම් බුදුරජාණන්වහන්සේගේ කරුණාව කියන එක සමහර කරුණු එක්ක ගලපා බැලුවයින් පස්සේ ස්පර්ශ කරන්නත් හරි අමාරුයි. කරුණාව කියන ගැන හිතන කොට ඇත්තට මේක පහළ වෙන්නේ කොහොමද, මේ කරුණාව කියන ගුණය පහළවෙන්නේ කොහොමද කියන එක සමහර තැන් වලදී හිතන්ට හරි අමාරුයි. ඒක සපර්ශ වෙන්නේ නෑ, අපි ඔය කරුණාව කරුණාව කියල කිව්වට. මේක මේ

මහත්මය අහපු හින්දයි මතු කරන්නේ සරල උදාහරණයක් ගත්තොත් එහෙම ලෝකයේ තියෙන දේවල් ලෝකයේ ඉන්න සත්වයෝ, සත්වයෝ නොවෙයි. ඒ සත්වයෝ ධාතු මාත්‍රා මිසක සත්වයෝ නොවෙයි - එතකොට ජීවයක් නොවෙයි - පුද්ගලයෙක් නොවෙයි - ආත්මයක් නොවෙයි - කෙනෙක් නොවෙයි - මමත් නොවෙයි - මගෙත් නොවෙයි යනුවෙන් එවැනි ධර්ම සමුදායක් අවබෝධ කරගෙන, මමෙක් නොවන මම කියන සංකල්පය සම්පූර්ණයෙන්ම අතුගා බිඳ හෙළුවාවූ බුදුරජාණන් වහන්සේගේ ඒ හිත නැවත කොහොමද සත්වයෙක් නොවන්නාවූ - පුද්ගලයෙක් - ජීවයක් - ආත්මයක් නොවන්නාවූ, පඨවි අපෝ තේජෝ වායෝ ධාතු සමුහයක මහා භූත උපාදාය ධර්ම හැටියට පවතින තැනකට සත්ව නොවන ජීව නොවෙන සිත් සමූහයකට, චෛතසික ධර්ම සමූහයකට සුවපත් වේවා කියල මෙත් සිත පැතිරෙව්වේ කියන එක සාමාන්‍ය හිතකට එහෙම තේරෙන්නේ නෑ. ඒක හරි අසීමිත බොහෝම ගාම්භීර කාරණයක්. ලෝකෝත්තර මට්ටමෙන් හිත තියෙන බුදුරජාණන්වහන්සේ උදේ පාන්දරට කරුණාවයි සත්වසංඥාවයි මතු කර ගන්නවා හැබෑවටම සත්වයෙක් නොවුනාට. හැබෑවටම ඇත්ත වශයෙන්ම සත්වයෙක් නෑ. නමුත් උන්වහන්සේ ප්‍රඥප්ති ධර්මයක් හැටියට සත්ව සංඥාව පිහිටුවල තමයි මහාකරුණාසමාපත්තියට සමවදින්නේ. ඒක මහා පුදුම, හිතන්ට බැරි ගාම්භීර ධර්මයක්. ඒක නිසා සමහර ධර්ම කොටස් තිබෙනවා - ඔය බුදුරජාණන්වහන්සේගේ බුදුගුණ හිතුවම මෙනෙහි කරහම ගොඩාක් ලොකුවට ප්‍රථම ධ්‍යානයෙන් නවතිනවා. බුදුගුණවඩලා ප්‍රථම ධ්‍යානය ගන්න පුළුවන්. ඊට වඩා ඉහළට යන්නේ නැත්තේ ධර්ම ගම්භීරත්වය හරි ඉහළයි. තව එකක් තියෙනවා, ලොව්තුරාබුදුඋනාට පස්සෙනේ ඔය කථාව කියමු. බුදුවෙන්ට කලියෙන් තමන්ගේ නෑදැයෝ නොවෙන හිතවතෙක් නොවන තමන්ට උදේ හවා හැන්දෑවේ දවල් කාලයේ විපතම පෙරළන විනාසයක්ම පතන විනාසයක්ම හිතන කෙනා කෙරෙහි, ඒවා දැක දැක ඒ මිනිසුන්ට මොකක්වත් කරන්නේ නැතුව ‘සුවපත්වෙවා’ කියන කරුණාවෙන් අදහස් ඉදිරිපත් කරගෙන ඇත්තට මේක මේ කුමට කරාද? ඇත්තට මේ වගේ මනසක් කොහොමද ඇතිඋනේ? අහවල් ඒකටද කියල ප්‍රශ්න නැගුවට පස්සේ බෝධිසත්වයන් වහන්සේගේ හිතේ තිබෙන අසිරිමත් කම - බුදුඋනාට පස්සේ බුදධත්වය ලැබුවට පස්සේ ගැඹුරු ධර්ම දේශනා කිරීම් වශයෙන් පිහිට උනා ලෝකයාට නමුත් ප්‍රාථමක වශයෙන් ඊට කලින් බැලුවයින් පස්සේ තමන්ටඋදව්වක් උපකාරයක් කරන්නේ නැති මේ වගේ පිරිසකට කිසිම සීමාවක් හිතන්නේ නැතුව, ගණනක් හිතන්නේ නැතුව, තැනකට කොටසක් කොටුකර ගන්නේ නැතුව, සත්ව ප්‍රඥප්ති අනන්තයකට සැපයක් ලබා දීමට මේ තරම් දුක්වින්ද කියන එක හරි අමාරුයි

හිතන්න. හරිම අමාරුයි. ඒක නිසා මේ බුදුගුණ හොඳට වැඩෙන්ට නම් ඔය ධර්මය හොඳට ඉගෙනගන්ට. එතකොට තව ඉස්සරහට ගැඹුරු ධර්ම තේරුම් ගන්න පුළුවන්.

අනන්ත අප්‍රමාණ පිං ස්වාමීන් වහන්ස. සාධු! සාධු! සාධු!

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන් වහන්ස අපි අර කථා කරපු මහග්ගත සිත්වලට අවසාන ලෝකෝත්තර මාර්ග සිත් 4 යි ලෝකෝත්තර ඵල සිත් 4 යි ඒකට අතුල්වෙන්නේ නැත්ද, ඇතුල් වෙනවද සවාමීන් වහන්ස.

<u>පිළිතුර</u> - ලෝකෝත්තර සිත් සහ මහග්ගත සිත් කියන්නේ වෙනස් ජාතියක්. මහග්ගත භාවයට ගියාවූ සිත් කියල කියන්නේ රූපාවචර අරූපාවචර සිත් 9 ය. ඊට පස්සේ ලෝකෝත්තර සිත් වෙනම. ඒ විදියටයි සලකන්නේ. තව එකක් තියෙනවා මහග්ගත සිත් හැටියට ධ්‍යාන සිත් තියෙනවා ඒවා සලකන්නේ ධ්‍යාන ලෝකෝත්තර සිත් හැටියට. රූපාවචර අරූපාවචර සිත් ටික විතරක් මහග්ගත හැටියට සලකා ගන්න. එතකොට ප්‍රශ්නයක් හිටින්නේනෑ. තෙරුවන් සරණයි!

තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස

<u>ප්‍රශ්නය</u> - අවසරයි ස්වාමීන්වහන්ස සත්ව පුද්ගල කියල ගණන් ගත්තම ස්වාමීන්වහන්ස අපි කඩල කඩල ගත්තම සත්ව පුද්ගලයෝ නැහැනේ ස්වාමීන්වහන්ස. එතකොට සාමාන්‍ය ලෝකයේ අපි කථා කරන භාෂාවෙන් සත්වයෝ කියන එකයි සූත්‍ර වල සත්ව කියන එකයි ගත්තම ඒ දෙකේ අර්ථ දැක්වීම් කොතනින්ද සීමා වෙන්නේ ස්වාමීන්වහන්ස.

<u>පිළිතුර</u> - ඕක තමයි තියෙන ප්‍රශ්නේ. එකේ demarcation එකක් නෑ. දැන් මෙතනින් එහාට සත්ව මෙතනින් එහාට ධර්ම කියල එහෙම සලකන්ට බැහැ. දැන් රහතන්වහන්සේටත් සත්ව කියල කියනවා. ඒ කියන්නේ දැන් ‘සියලු සත්වයෝ නිදුක් වෙත්වා නිරෝගී වෙත්වා’ කියන කොට අර ආර්ය සත්වයෝ කියල ගත්තට පස්සේ රහතන්වහන්සේලාත් සත්වයෝ කියල සලකනවා. ඊළඟට පෘතක්ජන සත්වයෝ කියල ගත්තහම කෙලෙස් නැතිකරපු නැති ඔක්කෝම සත්වයෝ කියල සලකනවා. ප්‍රඥප්තියේ හැටියට. එක ධර්මයක්වත් පරමාර්ථ වශයෙන් සත්වයෙක් නෙවෙයි. එක ධර්මයක්වත් පරමාර්ථ වශයෙන් පුද්ගලයෙක් නෙවෙයි ජීවයක් නෙවෙයි. සමහර තැන් තියෙනව මහත්තය ප්‍රශ්නයකට ගිහිල්ලා දෙපැත්තේ ඔළුව වැදි වැදී තියෙනවා. එකේ උත්තරේ එන්නෙ නෑ. හේතුව, සමහර කොටස් වලට හිත සූදානම් නෑ. අපේ සිත සමහර

කාරණයක් සලකා ගැනීමට ශක්ති සම්පන්න වෙලා නෑ. දැන් බලන්න කරුණාවයි මුදිතාවයි දෙකම තියෙන්නේ ලෝකයට සම්බන්ධව වැඩ කරන්නනේ; සත්ව සංඥාව ඇතුව කථාකරන අවස්ථාවේදීත් මෛත්‍රී වඩන්නනේ. හැබැයි සත්ව කියන වචනය මෙහෙමයි. සත්ව කියන වචනේ තණ්හාවට කියන නමක් මහත්මය. ඒ කියන්නෙ 'සත්ව' කියන එකේ තියෙනවා ඇලුන - යම් කිසි දේකට බැඳුණු - යම් කිසි දේකට නැමුණු කියන සත්ව කියන 'වචනයේ'තේරුම. දැන් අපි හිතමු යම් කිසි කෙනෙන් සංසාරයට ඇලුනයි කියල. ඉතින් සංසාරයට ඇලුනාවූ කෙනා සංසාරයට හිත නැමුනා වූ කෙනා 'සංසාර සත්ව'. ඒවගේම දිව්‍යලෝකයට ඇලුනාවූ කෙනා 'දිව්‍ය සත්ව'. මනුෂ්‍ය ලෝකයට ඇලුනකෙනා මනුෂ්‍ය සත්ව. තිරිසන් ලෝකයට ඇලුන කෙනා 'තිරිසන් සත්ව'. ප්‍රේත ලෝකයට ඇලුන කෙනා 'ප්‍රේත සත්ව'. දැන් බෝධිසත්වයින් වහන්සේලා බුදුබවට ඇලිල තිබෙන්නේ 'බෝධිය' කියන බුද්ධත්වයට මාර්ගඵල ධර්මයට ඇලිල තිබෙන්නේ. ඒක නිසා බෝධියට ඇලුන සිත් ඇතිකෙනා 'බෝධි සත්ව'. ඔය විදියටයි ඕකේ තියෙන්නේ. ඒක නිසා සත්ව කියන වචනයට අනුව අපි ගත්තොත් එහෙම ඒ සත්ව කියනතැන පාවිච්චි කරන්නෙ ස්පර්ශ වෙන්නේ 'තණ්හාව' තියෙන තැන. හැබැයි රහතන් වහන්සේටත් කියනවා සත්ව කියල. හැබැයි එතැනදී කථා කරන්නේ ප්‍රඥප්තියක් පමණයි. නාම පදයක් විතරයි. හැබැයි රහතන් වහන්සේ 'සිත' 'සත්ව' වෙන්නේ නෑ. අපි ඉතින් සියලු සත්වයෝ නිදුක් වේවා කියන කොට රහතන් වහන්සේත් අන්තර්ගත කරනවා. සමහර කරුණු තිබෙනවා හරිම ගාම්භීරයි. සමහර වෙලාවට සමහර ඒවා තියෙනව කියන්ටත් හොඳ නෑ වගෙත් තියෙනව. මිනිස්සු කුලප්පුවෙලායයි වත්දෝ කියල හිතෙනවා. සමහර ඒවා දැනගෙන තමන්ට තියාගෙන හිටියම හොඳයි කියලත් හිතෙනවා. සමහර ඒවා තියෙනවා අතිශය ගාම්භීරයි. අතිශය ගාම්භීරයි, ඒවා සුදුසු කෙනෙක් ඒවගේ හිතක් තියෙන, හිතන්න පුළුවන් ධර්මයක් තිබෙන හිතකට කිව්වොත් ඇරෙන්න අනිත් ඒවාට කියන්න යන්න හොඳත් නෑ. ඒවගේ තිබෙනවා. බුදුරජාණන් වහන්සේගේ පාරමී භූමිය හිතනකොට තමයි එහෙම වෙන්නේ. ඒක නිසා ගැඹුරෙන්ම ඔය ධර්මය හොඳට ඉගෙන ගන්ට. තේරුම් ගන්ට එතකොට බුදුරජාණන්සේගේ කියන්ට බැරි ගුණ සමූහයක් ඒ හිතට නොකියා වැක්කෙරේවි. තෙරුවන් සරණයි!

තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස ඒක ඇහුවේ පහුගිය කාලෙක එක ස්වාමීන්වහන්සේ කෙනෙකුත් මතු කරා. ඊට පස්සේ සත්ත සූත්‍රය කියල සංයුක්ත නිකායේ තියෙනවනේ ස්වාමීන්වහන්ස. දැන් අභිධර්මය විදියට ගන්න කොට

පැහැදිලියි ස්වාමීන්වහන්ස මේක කඩලා බලන කොට සත්ව කියල ගන්න දෙයක් නැහැ කියල. ඒ උනාට ස්වාමීන්වහන්ස ඒ සූත්‍රයේ තියෙන්නෙ ඔබවහන්සේ කිව් විදියටම පංචඋපාදාන ස්කන්ධය කෙරෙහි තණ්හාවෙන් රාගයෙන් ඇලුන නම් ඒ අයට සත්වයා කියනවා වගේ දෙයක් තිබුණ. එතකොට ස්වාමීන් වහන්ස මට තිබුණ ප්‍රශ්නෙ නිකන් ලෝකෙදි සම්මමුති වශයෙන් කථා කරනකොට මේ සූත්‍ර විදියට ගත්තොතින් එතකොට කවුරුහරි කෙනෙක් මේ පංචඋපාදාන ස්කන්ධයේ ඇලිල තියෙනවානම් සත්වයා කියන වචනය එතනට යෙදුනට ඒ අවස්ථාවේදී ඒක ගැලපෙනවා වගේ හිතුන. අර අභිධර්මයේ විදියට කෑලි කරලා බලනකොට නෙමේ සවමීන්වහන්ස. ඒක නිසයි ඒක ඇහුවේ. තෙරුවන් සරණයි!

<u>සවාමීන් වහන්සේ</u> - ඔව් ඒක හරි - ඒ කියන්නේ දැන් සත්වයෙක් කියල ගත්තයින් පස්සේ පංචඋපාදාන ස්කන්ධයට ඇලිච්ච එක, ඒක ගැලපෙනවා. සංසාරයට ඇලුනයි කියල කියන්නේ පංචඋපාදාන ස්කන්ධයට ඇලුන කියන එක තමයි. ඒක හොඳටම ගැලපෙනවා.

තව එක්ක තියෙනවා මට මේ අමතක වෙන්න ඉස්සෙල්ල මම කියන්නම්. වචන දෙකක් මම කියල දෙන්නම්. ඒක දැනුත් අහගන්න ඉස්සරහදිත් මගෙන් අහන්න. තවත් දේශකයානන් වහන්සේලාගෙනුත් අහන්න. පොත් පත්වලත් තිබුනොත් හොයාගෙන බලන්න. ධම් සාකච්ඡාවලත් හසුරුවන්න.

බුදුරජාණන්වහන්සේගේ දේශනාවේ තිබෙනවා ‘පරියාය දේශනා’ සහ ‘නිප්පරියාය දේශනා’ කියල. තව එකක් තිබෙනවා ‘නිරවශේෂ වශයෙන්’ දේශනා කරනවා. හොඳයි මම මේ කරුණු දෙක කියල කියන්නම්. මම මේක කියල දෙන්න හේතුව පහුගිය කාලෙත් එක්කෙනෙක් මගෙන් ප්‍රශ්ණයක් ඇහුව, මම හිතන්නේ ධම් මණ්ඩලයටත් එන එක්කෙනෙක් විය යුතුයි. ඒකයි, අපේ මේ පිංවත් මහත්මයාලටත් මේක හිතන්ටයි. පරියාය දේශනාවේ තිබෙන්නේ එක පැත්තක් පමණයි. එක පැත්තක් - එක කොටසක් - ඒක කාණ්ඩයක් පමණයි දේශනා කරන්නේ. ඒක දෙසන්ට හේතු වන්නේ ඒ අසන්නාවූ කෙනාටයි ඒ දේශනාව ප්‍රමාණවත් වෙන්නේ. දැන් අපි හිතමු මෙහෙම, පංචස්කන්ධයම දුකයි කියල බුදුරජාණන්වහන්සේ දේශනා කරනවනේ. හැබැයි ඔය පංචස්කන්ධය දුකයි කියල කියන්නේ නැතුව ඕකෙන් කොටසක් ගන්නවා. මේ රූපය දුකයි කියල කියනවා. අර රාහුල හාමුදුරුවන්ට බුදුහාමුදුරුවෝ දේශනා කරන්නේ. ඒවා ඇවිල්ල කොටස් දේශනා. ‘පරියාය’ - කොට්ඨාසයක් කියල දෙනවා. රූපය

දුකයි. රූපය හොඳ නෑ. රූපය හරිම කර්කෂකයි, කටුකයි. ඉතින් ඒ විදියට කියල දෙනවා. අනිත් ඒවාට අත ගහන්නේ නෑ. වේදනාව - සංඥාව - සංඛාර - විඤ්ඤාණ ඕවට මොකක්වත් කරන්නේ නෑ. හේතුව ඒවගේ සීමාවක් කරලා කොටස් කරලා දේශනා කරන්නාවූ ඒව පරියාය දේශනා වෙනවා. නිප්පරියාය දේශනා කියල තිබෙනවා. ඒ කියන්නේ කොටසක් කරන්නේ නැතුව ගන්නවා ඔක්කොම ටික රූපයයි වේදනාවයි සංඥාවයි සංඛාරයයි විඤ්ඤාණයයි ඔක්කොම lot එක දුකයි කියල ඉතිරි නැතිවම ගන්නවා. ආන්න එහෙම කරන දේශනා තිබෙනවා. මේක කියන්න හේතුව සමහර අය මේ ශූන්‍යතාවය ගැන කථා කරනවා. ශූන්‍යතාවය කියල කියන්නේ - මෙහෙම තියෙනවා - අනිමිත්ත විමොක්ෂ, අප්‍රණිහිත විමොක්ෂ, සුඤ්ඤත විමොක්ෂ කියල මාර්ග සිත්වලට කියනවනේ විමොක්ෂ කියල. ඉතින් මේ සමහර අය අර්ථ ගන්නන්ට යනවා නිවන් අවබෝධ කරගන්න අවස්ථාවේදී ඔක්කොම ශූන්‍යයයි මොකක්වත් නෑ කියල. මොකක්වත් දනේනෙත් නෑ පේන්නෙත් නෑ කල්පනා වෙන්නෙත් නෑ සත්වයෙක් පුද්ගලයෙක් මොකක්වත් නෑ කියල. හැබැයි කවදාවත්ම මාර්ග සිත්වලට බුදුරජාණන්වහන්සේ සුඤ්ඤත අනිමිත්ත අප්‍රණිහිත කියල නම් තැබුවාට ඒක ඇවිල්ල එක කාරණයක් නිසයි ඒක කියන්නේ. ඒක එක සිද්ධියක් නිසයි ඕවට නම් තියල තියෙන්නේ. හැබැයි ඔය මාර්ග සිත් ඵල සිත් හිස් නෙමෙයි. ඒ කියන්නේ මර්ග සිතකට සෝවාන් හෝ සකෘදාගාමී හෝ අනාගාමී හෝ අරහත් හෝ මාර්ග සිත් වලට ශූන්‍ය යයි කියල කියන්නේ ඒ සිත් වලින් සත්වයෙක් කියල කෙනෙක් බාර ගන්නේ නැති නිසා. ආත්මයක් කියල දෙයක් බාරගන්නේ නැති නිසා. පුද්ගලයෙක් ජීවයක් සදාකාලික දෙයක් බාර ගන්නේ නැතිනිසා තමයි ඒවාට ඔය නම් තියල තියෙන්නේ. හැබැයි ධර්ම වශයෙන් ඒවා ශූන්‍ය නෑ. ඒ කියන්නේ මාර්ග සිත්, ඵල සිත් ගත්තම ධර්ම වශයෙන් ශූන්‍ය වෙන්නේ නෑ හිස් වෙන්නේ නෑ. මාර්ග සිත තියෙනවනේ. ඒක ධර්මයක්. මාර්ග සිතේ තියෙනවනේ චෛතසික ධර්ම සමූහයක්. ඒවා ධර්ම. ඒවා සත්ව නොවන එක වෙන කථාවක් නමුත් ධර්ම ශූන්‍යත්වයක් එතන නෑ. මාර්ග සිත කියන ධර්මය තිබෙනවා. චෛතසික කියන ධර්ම සමූහය එකේ තියෙනවා. ප්‍රඥාව කියන ධර්මය එකේ තියෙනවා. ඒ හිත් වලට පේන්න අරමුණක් හැටියට නිර්වාණය කියල ධර්මයක් තියෙනවා. ඒක නිසා මේ 'මාර්ග සිත්' 'ඵල සිත්' කියන ඒවා ධර්ම වශයෙන් ශූන්‍ය නෑ. ශූන්‍ය වෙන්නේ ඊට කලින් අරගෙන තිබිච්ච සත්වයෝ හැටියට බාර ගන්න එක එතන නැති එකයි. ඒකත් ඕකට අතිරේකයක් හැටියට ඔය පැත්තකින් තියා ගන්න. තෙරුවන් සරණයි!

බොහොම පිං සවාමීන් වහන්ස සත්වයා කියල කියන්නේ ධර්ම සමූහයක් එකට එකතුවෙලා තියෙන දේකටද නැත්නම් භවයෙන් භවයට යන මොකක් හරි දෙයකටද කියල මට පැහැදිලි කර ගන්න ඕන ස්වාමීන් වහන්ස.

<u>ස්වාමීන්වහන්සේ</u> - එතන සත්වයා කියල ප්‍රඥප්තියක් ප්‍රකාශ කරනවා. ප්‍රඥප්තියක් තියාගෙන තියෙනවා ස්කන්ධ පංචකයේ ඇලීම් සහිත වූ - තණ්හාවෙන් මිදී නොගියා වූ ස්කන්ධ පංචකය දිගට ක්‍රියාත්මක වීම අල්ලගෙන. ඊට එහා මොකක්වත් නෑ. ලෝක ව්‍යවහාරයේ හැටියට, ඒ ස්කන්ධ පංචකය ක්‍රියාකාරී වූ ඒකේ තිබෙන්නාවූ අංගයකුත් අල්ලගෙන ප්‍රකාශ කිරීම සඳහා තමයි ඔය සත්ව කියන එක ප්‍රකාශ කරන්නේ ඊට වඩා දෙයක් නෑ. 'අත්ත' කියල එහෙකුත් තියෙනවා. ඔය ලෝකයට දේශනා කරපු ප්‍රඥප්ති දේශනාවල් එක්ක තමයි ඔය හැප්පීම තියෙන්නේ. එක තැනක් තියෙනවනේ මෙහෙම ආත්ම සංඥාව බිඳ හෙලන්ට කියල එක තැනක කියනවා. ඊට පස්සේ ධම්ම පදයට ගියත් පස්සේ තිබෙනවා **'අත්තා හි අත්තනො නාථො'** = 'තමන්ට තමන්මයි පිහිට' කියල එතන කියනවා. ඊට පස්සේ ඒ ධම්ම පදයේ තව ටිකක් මාර්ග වර්ගයේ යනකොට කියනවා **'සබ්බෙ ධම්මා අනත්තා'** = 'සියලු ධර්මයෝ අනාත්මයි' කියල. දැන් ඒ කතාවෙන් තේරෙනවනේ - **'අත්තා හි අත්තනො නාථො'** - කියල කියන්නේ පංච ස්කන්ධයට තමයි නමුත් ඒක ලෝක සම්මුතියේ ලෝක ව්‍යවහාරයේ පිහිටා කථා කරනවා. ඊළඟට **'සබ්බෙ ධම්මා අනත්තා'** කියන කොට ලෝක ව්‍යවහාරය කථා කරන්නේ නෑ. එතැනදී ලෝක ව්‍යවහාර කථාවෙන් අයින්වෙලා එතනදී ධර්ම ස්වභාවය කථා කරනවා. ධර්ම වශයෙන් ගත්තට පස්සේ අනාත්මයි. ඒකනිසා ලෝක ව්‍යවහාරයේ ප්‍රඥප්තියේ විතරයි මහත්තය ඔය සත්ව කථාව තියෙන්නේ. තෙරුවන් සරණයි!

<u>අදහස් ප්‍රකාශ කිරීමක්</u> - අවසරයි ස්වාමීන්වහන්ස අපි මේලෝකෙට ඉපදෙනවා. ඒකට අම්මට තාත්තාට කරන්න දේකුත් නැහැ. අපිට කරන්න දේකුත් නෑ. මේ ස්වභාව ධර්මය නිසා තමයි අපි දුක් විද විද ජීවත් වෙන්නේ. ස්වභාව ධර්මයේ නීතිය තමයි මේක. උප්පාද ඨිති භංග ඉපදෙනවා පවතිනවා නැතිවෙනවා. මේකට කාටවත් කරන්න දෙයක් නැහැ. සත්ව පුද්ගල විදියට බැලුවේ නැති උනොත් මේ ලෝකේ මිනිස්සු විතරක් නෙමෙයි මුළු සත්වයෝම තණ්හාව නිසා ඇලිල ඇලිල ඉන්නවා. මේක නැති කර ගන්න බෑ. මොකද මේක පුරුද්දක් වශයෙන් ඇවිල්ල තියෙනවා. එතකොට දැන් භාවනා කරන කොට ඇත්තටම සත්ව ප්‍රඥප්තිය ගත්ත ගමන් භාවනාව පොඩ්ඩක් කැඩිලා යනවා. දුක් විදින මිනිස්සු දැක්කහම ඒ

මිනිස්සු ගැන දුකත් හිතෙනවා. මොන තරම් යුද්ධයක් කරනවද මොනතරම් අරගලයක් කරනවද මිනිස්සු ජීවත්වෙන්න. මුළු සමාජයටම උදව් කරන්නත් දඟලනවා. නමුත් අපි හැම දෙනාම ජරාවට පත්වෙලා මරණයට යනවා. ඇත්තටම මේකේ ඇති දෙයක් නෑ. බුදුරජාණන්වහන්සේ ධර්මය දේශනා නොකළ නම් අපිට මේ තරම්වත් මේ හිත තියාගෙන ඉන්න දන්නේ නෑ අපි. මම හිතන්නේ බුදුරජාණන්වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව වැඩි වෙලා අපි ඒ මාර්ගයේ ගමන් කරන්නේ - ස්වාමීන් වහන්ස ඔබ වහන්සේ මොකක්ද දේශනා කරන්නේ මම කියන දේ ගැන

<u>ස්වාමීන්වහන්සේ</u> - අපේ මහත්මිය කියපු දේ යම් යම් හිතීම් තිබෙනවා. ඔය සමහර කොටස් තිබෙනවා ඒව ලෝකයට සම්බන්ධ දේවල් අපි ධර්මත් එක්ක ගත්තයින් පස්සේ වාක්‍ය ගතකරන්න අමාරුයි. ඒකට වාක්‍යයක් සකස් කරන්ට අමාරුයි. හේතුව මහා සම්භාරයක් සංකලනයක් ඕක අස්සේ තියෙන්නේ. සමාජ කථා දෙමව්පියෝ අපේ වට පිටාව ස්වභාව ධර්මය ඕවා ව්‍යවහාරික දේවල්වල ඕලාරික පැති. ප්‍රඥප්තියෙත් ලෝක ව්‍යවහාරයෙත් හරිම ගොරෝසු පැති. ඊට පස්සේ සියුම් වෙලා යනකොට ඇත්තවශයෙන්ම ස්වභාව ධර්මය ගත්තම ඔක්කොම ස්වභාව ධර්ම තමයි. දැන් ඔය තියෙනවනේ සිත. ඇත්ත වශයෙන්ම ඒක ඇවිල්ල එක්තරා විදියකට ඒකටම අයිති ඒකටම අවේනික ස්වභාවයක් දරාගෙන ඉන්නාවූ එක්තරා ගතියක්. චෛතසිකත් ඒවගේ. රූපත් ඒවගේ. ඉස්සරහට ඉස්සරහට ගැඹුරට යනකොට සවභාව ධර්මය හැටියට අපි සලකන්නාවූ දේවල් වල තිබෙනවා තව කාණ්ඩ කොට්ඨාස පොඩියට බෙදන්න පුළුවන්. අපි ස්වභාවධර්ම තමයි බෙදාගෙන බෙදාගෙන යන්නේ. ඒවා බෙදාගෙන යනකොට අවසානයේදී ධර්ම ස්වභාවයක් මතුවෙනවා. ඒක අපිට හම්බ වෙච්ච නැති මෙහෙදී බලන කොට හරිම අස්වාභාවික නමුත් ඒකනම් හැබෑ ස්වභාවයක්. ඒ තමයි පරමාර්ථ ධර්ම. එතකොට පරමාර්ථ ධර්ම අපි නුවණින් ස්පර්ශ කරන කොට, අපි මේ දක්වාම ස්වභාවය බලාගෙන හිටියම අපිට හරිම අස්වාභාවික බවට පත්වෙනවා. හැම ප්‍රශ්නයක්ම සරලව ගත්තහම හැම ප්‍රශ්නයක්ම තියෙන්නේ 'හේතු ඵල' තියෙන තැනමයි. එයින් අයින් වෙච්ච තැන ඔය කිසි කරච්චලයක් බැඳීමක් මොකක්වත් නෑ. දැන් සමහර වෙලාවට මේ ඉඳගෙන ඉන්නකොට හිතෙනවා - ඉස්සරනම් හිතුනේ පුටුවේ ඇදෙයි කියල. එක පාරක් හිතන් හිටිය පුටු හදපු එක්කෙනාට එක්කෝ ගෙවල් අයිතිකාරයට බනිනවා - පුටුවක් ගන්න බැරිද - නැත්නම් අම්මල තාත්තාලට මෙච්චර කරනවා හොඳට වාඩිවෙන්න පුළුවන් පුටුවක් ගන්න බැරිද - හැමවෙලේම ඉස්සර කාටහරි

දෝසෙ පවරනවා. නමුත් පස්සේ පස්සේ මේ ධර්මයත් එක්ක යනකොට තේරෙනවා පුටුවට බැනල වැඩකුත් නෑ අනිත් අයට බැනල වැඩකුත් නෑ ඇත්තටම බැන ගන්න ඕන වෙන්නේ මටමයි කියල. හේතුව ඇයි මේ කකියන පුටුවක වාඩි කරලවත් තියාගන්න බැරි කරච්චල්කාරී ඇඟක් හදාගත්තේ. හිත නෙමෙයිනේ. මේ ඇඟක් හදා ගත්තු හින්ද ඒකනේ කකියන්නේ ඒකනේ ඇදකුද වෙලා තියෙන්නේ. ඉතින් ඒක ඇවිල්ල කාගෙවත් වරදක් නෙමෙයිනේ. ඒක හින්ද ගැඹුරෙන් බලාගෙන යනකොට තමන්ම තමයි මේ වැරදි කාරය සහ හේතුඵල ධර්ම රාමුව අස්සේ ඉඳගෙන මේ ඇඟක් හදාගත්ත හින්ද තමයි ඔක්කොම පැටලවිලි. ආන්න ඒ වගේ ඉතින් හිතන එකත් හොඳයි. ඒ මහත්මියට තිබෙනවා යමක් කියා ගන්ට ඕනකම තියෙනවා සමහර ඒවා වාක්‍යට දාගන්න බැරි කමක් තියෙනවා. ඔය විදියට මෙනෙහි කරගෙන යන්ට. ධර්මයත් ඉගෙන ගන්ට එතකොට ප්‍රශ්නෙ ඉවරවෙලා යයි. තෙරුවන් සරණයි!

<u>ජයන්ත මහත්මයා </u>- තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස ඔබවහන්සේගේ කාල වෙලාවත් සලකල මම හිතනවා අද දවසේ සාකච්ඡාව මෙතනින් නිමා කරමු කියල. අපිට මේ අවස්ථාව ලබාදෙන හැමදාමත්ම මේ ඉතාමත්ම ගැඹුරු අභිධර්ම සාකච්ඡා හා අනෙකුත්  ධර්ම සාකච්ඡා කිරීමට මේ පසුතලය සකස් කරලා දීපු දළුවත්ත මහත්මයාටත් අද කරගත් සියලුම කුසල කර්මයන් අනුමෝදන් වීමෙන් ඒ පවත්නාවූ අසනීප තත්වයන් දුරුවේවා! චිරජීවනය සැලසේවා කියල ප්‍රාර්ථනා කරනවා. ඒවගේම ස්වාමීන්වහන්සේ අපිට වෙහෙස නොබලා කාලය නොබලා මේ මධ්‍යම රාත්‍රියටත්  කිට්ටුවන වෙලාවේ අපිට මේ අයුරින් අනුග්‍රහය දැක්වීම අපගේ ඉතාමත්ම භාග්‍යක්. ස්වාමීන්වහන්ස සවනට සිසිලස වෙනුවෙනුත් සියලු කල්‍යාණ මිත්‍රයන් වෙනුවෙනුත් ඔබ වහසේගේ පාද නමස්කාරකොට මේ සියලු පිං ඔබවහන්සේට අනුමෝදන් කරනවා. ස්වාමීන්වහන්ස ඔබ වහන්සේට යොමුවෙනවා අද දවසේ සාකච්ඡාව නිමා කරන්න. තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස!

<u>ස්වාමීන්වහන්සේ</u> - හොඳයි සැම දෙනාටම තෙරුවන් සරණයි! අපි අදත් එක්තරා ධර්ම කොට්ඨාසයක් එක්තරා ප්‍රදේශයක්  තමයි දේශනා කරේ. සාකච්ඡාවට ඉදිරිපත් කරගත්තේ.  මම තරමක් සතුටකටත් පත්වෙනවා අපේ අර සමහර පින්වතුන් තමන්ට දැනිච්ච පෙනිච්ච හැටියට ධර්ම කරුණු මේ විදියදැයි කියල අහපු  වෙලාවේ. ඉතින් සමහර කරුණු හොඳට ඒවා කියවල අහල ඒවා සාකච්ඡා කරලා පෙළ ගස්සාගෙන තියෙන බවක් පේනවා. හැම එක්කෙනාටම ඒ ශක්තිය ලැබේවා කියල අපි මෛත්‍රියෙන් ආශීර්වාද කරනවා. ඒවගේම බුදුරජාණන්

වහන්සේගේ ගුණ දකින්ටත් සූවිසි ගුණ දැනගන්ටත් මේ ගැඹුරු ධර්මය අස්සට ගියැන් පස්සේ තමයි ඒ හිතන්ට බැරි අනන්ත ගුණ සමුදායක් අපේ හිතට නිකං ඡායා මාත්‍ර හැටියට හරි ඉදිරිපත්වෙලා පේන්නේ. ඒකටත් උපකාර කරනවා මේ ධර්ම ඉගෙන ගැනීම. මේ වාසනාව ඉතින් හැම එක්කෙනාටම ලබාදීම සඳහා පුරෝගාමීව කරුණාවෙන් දයාවෙන් යුක්තව අවුරුදු ගානක් තිස්සේ මේ වැඩේ කරගෙන ගියේ අපේ පිංවත් ලලිත් දළුවත්ත මහත්මයා. ඒ ලලිත් දළුවත්ත මහත්මයාටත් ඒ මහත්මියටත් පවුලේ දූ දරුවන් සැමදෙනාටමත් ශාන්තියක් සැනසිල්ලක් යහපතක්ම වේවා කියල අපි මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරමු. ඒ පිංවත් මහත්මයාගේ ජීවිතයට පැමිණ තිබෙන අපල උපද්‍රව කරදර බාධක ඒවගේම ග්‍රහ දෝෂ ධර්ම අතීත අකුසල කර්ම බලවේග සියල්ලක්ම වහ වහාම යටපත් වේවා! කුසල් කර්ම බලවේග ශක්තිය ධර්ම ශක්තිය මතුවේවා! ඒ මහත්තයගේ ජීවිතයට ශාන්තියක් සැපයක් වේවා! පවතින ලෙඩ දුක් සියල්ලම සමනය වෙලා නිරෝගී භාවය සැලසිලා දීර්ඝායුෂ ලබාගෙන මේ ධර්ම සේවාව චිර කාලයක් ලෝකයට හිත සුව පිණිස පවත්වාගෙන යන්ට ලැබේවා කියල මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරමු. මේ ධර්ම මණ්ඩපය මෙහෙයුවා වූ පිංවත් ජයන්ත මහතාටත් අනෙකුත් අසාගෙන සිටි ප්‍රශ්න ඇසූ ඒ පිංවත් මහත්ම මහත්මීන් සැමදෙනාටමත් මේ උතුම් ධර්ම මෙනෙහි කිරීමෙන් හිතීමේ ඇසීමේ මනසිකාර පැවැත්වීමේ කුසල බලයෙන් ඒකාන්තයෙන්ම තව තවත් හොඳට ශ්‍රද්ධාවෙන් ධර්මය අහගෙන, ඒවගේම සමාධි ගුණය වඩාගෙන මෙනෙහි කරගෙන සම්මාදිට්ඨිය ප්‍රඥාව ආලෝකයෙන් ආලෝකයට පත්වන ආකාරයට වඩාගෙන, කෙලෙස් නසාගෙන බුදුරජාණන්වහන්සේලා පසේබුදු මහරහතන් වහන්සේලා විසින් ශාන්තයි හොඳයි සැපයි කියා අවබෝධ කොට ගත්තාවූ සදාකාලික සැප ඇති අමාමහ නිවනින් සැනසෙන්ට ලැබේවා ! නිවන් පිණිස සැමදෙනාටම මේ කුසල් මේ පිං හේතු වාසනාවේවා! කියල පින්දෙමින් ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලබෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහ



ඉහත සඳහන් ධර්ම දේශනාව
අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.